232 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 232 - இல. 3
**Volume 232 - No. 3**

**2015 ජනවාරි 30 වන සිකුරාදා**
2015 சனவரி 30, வெள்ளிக்கிழமை
**Friday, 30th January, 2015**


# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**අග්‍රවිනිශ්චයකාර මොහාන් පීරිස් මහතා පොලීසියට කළ පැමිණිල්ල :**
ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය

**වරප්‍රසාද:**
කාර්යාලය වටලා සීල් තැබීම

---

# பிரதான உள்ளடக்கம்

**பிரதம நீதியரசர் மொஹான் பீரிஸ் அவர்கள் பொலிசில் செய்த முறைப்பாடு:**
மாண்புமிகு பிரதம அமைச்சரினது கூற்று

**சிறப்புரிமை :**
காரியாலயம் சுற்றிவளைக்கப்பட்டு ‘சீல்’ வைக்கப்பட்டமை

---

# PRINCIPAL  CONTENTS

COMPLAINT TO POLICE BY CHIEF JUSTICE MOHAN PEIRIS:
Statement by Hon. Prime Minister

PRIVILEGE:
Raiding and Sealing of Office

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2015 ජනවාරි 30 වන සිකුරාදා***
*2015 சனவரி 30, வெள்ளிக்கிழமை*
*Friday, 30th January, 2015*

**අ. භා.1.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் பி.ப. 1.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.30 p.m.,
MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA]
in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - வெகுசன ஊடக, பாராளுமன்ற அலுவல்கள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Mass Media and Parliamentary Affairs and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් 2012 වර්ෂය සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අදාළ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කරුපයියා වේලායුදම් මහතා (වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கருப்பையா வேலாயுதம் - பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Karuppaiah Velayudam - State Minister of Plantation Industries)

Hon. Speaker, I present the following petitions:

1. A petition from Mr. B.J.D. Karunathilaka of "Apeksha", Eduragala, Ingiriya;
2. A petition from Mr. C. Vithanage of No. 188/2 B, Rathmaldeniya Road, Pannipitiya;
3. A petition from Mr. N.B. Rathnayaka of No. 27 A, Kumaradasa Place, Wellampitiya;
4. A petition from Mr. U.A.G. Heras of Sri Lanka Insurance Corporation Limited, Avissawella Branch;
5. A petition from Mr. V.D. Sunil Wilfred of No. 70/16, St. Rita's Avenue, Ratmalana;
6. A petition from Mrs. L.S.P. Koswaththa of No. 60A, Gnanalankara Mawatha, Ratnapura;
7. A petition from Mrs. M.D.T.K. Munasinghe of No. 541/2 G, 3rd Lane, Wewahena Road, Ranmuthugala, Kadawatha;
8. A petition from Mrs. M.G.D.N. Meddegoda of Sri Lanka Insurance Corporation Limited, Kandy Branch;
9. A petition from Mrs. Manori Polonnovita Arachchi of No. 126/3/1/A, Mahabodhi Mawatha, Pahala Karagahamuna, Kandy Road, Kadawatha;
10. A petition from Mrs. P.A. Inoka Kularathne of No. 2/14, Uyankale Road, Panadura;
11. A petition from Mrs. U.S.P. Liyanage of Sri Lanka Insurance Corporation Limited, Ambalangoda Branch;
12. A petition from Mrs. W.K. Samarasinghe of Sri Lanka Insurance Corporation Limited, Metropolitan Branch, Kurunegala;
13. A petition from Mrs. W.N.D. Illeperuma of Sri Lanka Insurance Corporation Limited, Elpitiya Branch;
14. A petition from Mrs. Wasantha Rohini Muhandiramge of No. 67/2 B, Weera Mawatha, Depanama, Pannipitiya; and
15. A petition from Ms. Sujeewa Munasinghe of Sri Lanka Insurance Corporation Limited, Thambuththegama Branch.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) හිඟුල, උහන්ගොඩ යන ලිපිනයෙහි පදිංචි ඒ. ජයන්තිස්ස මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) වරකාපොල, නුවර පාර, අංක 82 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ප්‍රේමලතා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(3) අටාල, අරන්දර, "ජයමැදුර" යන ලිපිනයෙහි පදිංචි ඩී. කුමාරදාස ජයරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) රුවන්වැල්ල, වැන්දල යන ලිපිනයෙහි පදිංචි ජී. වික්‍රමසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු සී.ඒ. සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சீ.ஏ. சூரியஆரச்சி)
(The Hon. C.A. Suriyaarachchi)

ගරු කථානායකතුමනි, පොලොන්නරුව, කදුරුවෙල, දිමුතුගම, අංක 30 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්. ශ්‍රේෂන් සුනිල් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அன்டனி)
(The Hon.Victor Antony)

හලාවත, පැරණි වීදිය, අංක 33/7 දරන ස්ථානයෙහි පදිංචි එච්.ඊ. ජැන්ස් මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අමාත්‍යාංශ නිවේදන - ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය.

## අග්‍රවිනිශ්චයකාර මොහාන් පීරිස් මහතා පොලීසියට කළ පැමිණිල්ල : ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය

## பிரதம நீதியரசர் மொஹான் பீரிஸ் அவர்கள் பொலிசில் செய்த முறைப்பாடு: மாண்புமிகு பிரதம அமைச்சரினது கூற்று

## COMPLAINT TO POLICE BY CHIEF JUSTICE MOHAN PEIRIS: STATEMENT BY HON. PRIME MINISTER

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremasinghe - Prime Minister, Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ඊයේ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා මෙතැනදී මතු කළ කාරණයක් තිබුණා. එතුමා මෙතැන ප්‍රකාශ කළේ අග්‍රවිනිශ්චයකාර මොහාන් පීරිස් මැතිතුමාට එල්ල කර තිබෙන තර්ජනය ගැන. ඇත්ත වශයෙන්ම එහෙම තර්ජනයක් වුණා කියලා ජනවාරි 27වැනි දා 9.30ට කුරුඳුවත්ත පොලීසියට පැමිණිලි කරලා තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Hon. Prime Minister, I did not raise that. The Statement was made by the Hon. Leader of the Opposition.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

Sorry, you raised the point of Order.

ඒ අනුව පැමිණිල්ල ඉදිරිපත් කරලා තිබෙනවා. දැනට ඒ පැමිණිල්ල සම්බන්ධයෙන් කුරුඳුවත්ත පොලිස් ස්ථානය මඟින් මූලික විමර්ශනයක් සිදු කර, ජනවාරි 28වැනි දින කොළඹ මහේස්ත්‍රාත් උසාවියේ නඩු අංක බී/211/63/1/15 යටතේ ගරු අධිකරණයට වාර්තා කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාසය මඟින් වැඩි දුරටත් විමර්ශනය සිදු කරගෙන යනු ලබයි. පෙබරවාරි 9වැනි දිනට නැවත නඩුව කැඳවීමට නියමිතව ඇති බව නියෝජ්‍ය පොලිස්පති විසින් වැඩිදුරටත් වාර්තා කර ඇත. So, there is an on-going police investigation and the matter will be taken up in the court on the 9th of February.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මේ පිළිබඳ සම්පූර්ණ ප්‍රකාශයක් අද කරනවා කියලා මම කිව්වා. ඒ වාගේම අපි කොහොමද මේ පිළිබඳව විවාදයක් පවත්වන්නේ කියලා මගේ මෙම ප්‍රකාශයෙන් පසුව පක්ෂ නායකයින්ට තීරණය කර ගන්න වෙයි. මගේ ප්‍රකාශය අවසන් වුණු ගමන්ම ඒ ගැන කථා කරන්න පක්ෂ නායකයින්ට මුණ ගැහෙන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, අගවිනිසුරු තනතුර සම්බන්ධ සියලු කරුණු අද මේ සභාව වෙත ඉදිරිපත් කරන බවට මම ඊයේ පොරොන්දු වුණා. ඒ පොරොන්දුව ඉටු කරමින් විශේෂ ප්‍රකාශයක් කරන්නයි මම මේ සැරසෙන්නේ. විපක්ෂ නායකතුමා පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 23(2) යටතේත් එවැනි විමසීමක් පිළිබඳව ඔබතුමාට දැනුම් දුන්නා. නමුත් විශේෂයෙන්ම දැනට මේ කාරණය මතු වෙලා තිබෙන නිසා ඒ අනුව සාකච්ඡා කළ යුතු බැව් දැනුම් දී ඇති බවට මට දැනුම් දුන්නා.

ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙකු ඉවත් කිරීමේ ක්‍රියා පටිපාටිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 (2) ව්‍යවස්ථාවේ මේ අයුරින් දක්වා තිබෙනවා:

> "ඉහත කී සෑම විනිශ්චයකාරවරයෙක් ම යථා පැවැත්මෙන් සිටිනාතාක් ධුරය දරන්නේ ය. ඒ යම්කිසි විනිශ්චයකාරවරයකු ඉවත් කිරීම සඳහා ඔප්පු වී ඇති විෂම පැවැත්ම හෝ අබලතාව හෝ පදනම් කොටගෙන (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් බහුතර සංඛ්‍යාවක් විසින් සම්මත කරන ලද පාර්ලිමේන්තුවේ යෝජනාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබීමෙන් පසුව ජනාධිපතිවරයා විසින් කරන ලද නියමයකින් හැර ඒ විනිශ්චයකාරවරයකු ඉවත් කළ නොහැක්කේ ය :"

ඒ ව්‍යවස්ථාවට බැඳී මෙන්න මේ ලෙසත් සඳහන් වෙනවා:

> "එසේ වුව ද, එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා වූ යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් යටත් පිරිසෙයින් තුනෙන් එකක් විසින් අත්සන් තබා ඇත්නම් හා චෝදිත විෂම පැවැත්ම හෝ අබලතාව පිළිබඳ සම්පූර්ණ විස්තර එහි දක්වා ඇත්නම් මිස කථානායකවරයා විසින් එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා වූ කිසිම යෝජනා සම්මතයක් භාර ගැනීම හෝ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම හෝ නොකළ යුත්තේ ය."

අග්‍ර විනිශ්චයකාර ධුරය දැරූ ශිරානි බණ්ඩාරනායක මහත්මිය එම තනතුරින් ඉවත් කිරීම සඳහා වූ යෝජනාවක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 117 දෙනෙකු විසින් අත්සන් කොට ගරු කථානායකතුමාට භාර දුන්නා. එම යෝජනාව මඟින් අග්‍ර විනිශ්චයකාරතුමියට විරුද්ධව චෝදනා 14ක් ගොනු කර තිබූ අතර, එම චෝදනා විභාග කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කළ යුතු යැයි යෝජනා කෙරුණා. එම යෝජනාව 2012 නොවැම්බර් 6වැනි දා පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට ඇතුළත් කළා. න්‍යාය පත්‍රයේ අංක 20 යටතේ ඉදිරිපත් කෙරුණු ඒ යෝජනාව මෙසේයි:

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍රවිනිශ්චයකාර ධුරයෙන් ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංගුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීම සඳහා අතිගරු ජනාධිපතිවරයා වෙත පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් ඉදිරිපත් කිරීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2) ව්‍යවස්ථාව ප්‍රකාර යෝජනාව"

එම යෝජනාව අවසානයේ මෙසේ සඳහන් වුණා:

"එබැවින්, ඉහත සඳහන් විෂමාචාර චෝදනා හේතුවෙන්, එම විෂමාචාර චෝදනා පිළිබඳ පරීක්ෂා කර එම චෝදනා එකක් හෝ එයට වැඩි ගණනක් ඔප්පු වී ඇතැයි විශේෂ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබුවහොත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍ර විනිශ්චයකාර පදවියෙන්, ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංගුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීම සඳහා යෝජනාවක් අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කළ හැකි වන පරිදි පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි.....

ගරු කථානායකතුමනි, මා එය නැවතත් කියවන්නම්:

"එබැවින්, ඉහත සඳහන් විෂමාචාර චෝදනා හේතුවෙන් එම විෂමාචාර චෝදනා පිළිබඳව පරීක්ෂා කර එම චෝදනා එකක් හෝ එයට වැඩි ගණනක් ඔප්පු වී ඇතැයි විශේෂ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබුවහොත්"

ඒ කියන්නේ, එම චෝදනා එකක් හෝ ඊට වැඩි ගණනක් ඔප්පු වී ඇති බව පාර්ලිමේන්තුවට වාර්තා කරන්න ඕනෑ. අන්න එහෙම අවස්ථාවක,

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍ර විනිශ්චයකාර පදවියෙන්, ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංගුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීම සඳහා යෝජනාවක් අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කළ හැකි වන පරිදි පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි "

අන්න එහෙම නම් ඒ විශේෂ කාරක සභාව පත් කරන්න කියලා,

"ඉහත නම් සඳහන් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(3) ව්‍යවස්ථාව සමඟ කියැවෙන 107(2) ව්‍යවස්ථාවේ විධිවිධාන සහ, 78අ දරන පාර්ලිමේන්තු ස්ථාවර නියෝගය ද ප්‍රකාරව යෝජනා කර සිටිමු."

ගරු කථානායකතුමනි, එයින් අදහස් කරන්නේ මේ කාරණා ගැන සොයා බලන්න විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලායි.

ගරු ශිරානි බණ්ඩාරනායක මහත්මිය අග්‍ර විනිශ්චයකාර ධුරයෙන් ඉවත් කිරීම සඳහා 2012 වසරේ නොවැම්බර් 06වැනි දා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කෙරුණු යෝජනාව විභාග කිරීම සඳහා විශේෂ කාරක සභාවක් පත් කළ බව 2012 නොවැම්බර් 14වැනි දා ගරු කථානායකතුමන් විසින් නිවේදනය කළා. එම නිවේදනය කළේ ස්ථාවර නියෝග 78අ. යටතේයි. ආරම්භයේ සිටම මෙම ක්‍රියාදාමය නීත්‍යානුකූල වූයේ නැති බව මම මෙහිදී අවධාරණය කරන්න කැමැතියි. ස්ථාවර නියෝග 78අ. මඟින් දක්වා ඇත්තේ විශේෂ කාරක සභාවක් පත් කිරීම සම්බන්ධවයි. නමුත්, මෙහිදී ඉදිරිපත් වී තිබුණේ විනිශ්චයකාරවරයෙකු ඉවත් කිරීම සඳහා ජනාධිපතිවරයා ඇමතීමේ යෝජනාවක් පිළිබඳ දැනුම් දීමක්. ස්ථාවර නියෝග 78අ. (2) මඟින් දක්වා ඇත්තේ කථානායකතුමා පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් පත් කිරීම පිළිබඳවයි. එය නිරායාසයෙන්ම සිදු වන්නක්. එසේ කිරීම සඳහා වෙනමම යෝජනාවක් අවශ්‍ය වන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම ස්ථාවර නියෝග 78අ. (1) අනුව යෝජනාව විතරයි වුවමනා වන්නේ. ඒ යෝජනාව හරියට charge sheet එක වාගෙයි. එතකොට ඒ විශේෂ කාරක සභාව පත් කිරීම නිරායාසයෙන්ම සිදු වෙනවා; මේ ක්‍රියාදාමය කොහොමත් automatically සිදු වෙනවා. ඒක හරියට උසාවියට චෝදනා පත්‍රය ඉදිරිපත් කළාම නඩු අහන්න සිදු වනවා වාගේ වැඩක්.

කෙසේ වෙතත්, විශේෂ කාරක සභාවක් පත් කිරීම සඳහා 2012 නොවැම්බර් 06වැනි දා යෝජනාවක් ඉදිරිපත් කෙරුණා. 2012 දෙසැම්බර් 08වැනි දා විශේෂ කාරක සභාව තම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. එහි මාතෘකාව වූයේ, "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාර ධුරයෙන් ගරු ආචාර්ය ශිරානි අංගුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීම සඳහා අතිගරු ජනාධිපතිවරයා වෙත පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් ඉදිරිපත් කිරීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2) ව්‍යවස්ථාව ප්‍රකාර යෝජනාව" යනුවෙනි. ආචාර්ය බණ්ඩාරනායක මහත්මියට විරුද්ධව ඉදිරිපත් කෙරුණු චෝදනා තුනක් ඔප්පු වී ඇති බව විශේෂ කාරක සභාව අනාවරණය කළා. තවත් චෝදනා දෙකකට ඇය නිදොස් බව අනාවරණය වූ අතර, අනික් චෝදනා නවය නොතකා හැරීමට විශේෂ කාරක සභාව තීරණය කළා.

2012 දෙසැම්බර් 08වැනි දා පාර්ලිමේන්තුවේ විපක්ෂය එම වාර්තාවේ අන්තර්ගතය පිළිබඳව පාර්ලිමේන්තු විවාදයක් ඉල්ලා සිටියා. ඒ අනුව 2012 දෙසැම්බර් 08වැනි දාට පසුව ඒ පිළිබඳව විවාදයක් දිය හැකි බව කථානායකතුමා ප්‍රකාශ කළා. (පාර්ලිමේන්තු විවාද 2012 දෙසැම්බර් 08වන සෙනසුරාදා හැන්සාඩ් වාර්තාව - 213 -1 වෙළුම - 3108 කොළම)

ස්ථාවර නියෝග 78අ. (6)හි සඳහන් වන්නේ විශේෂ කාරක සභාව මඟින් සොයා ගන්නා කරුණු සහ අදාළ සාක්ෂි පිළිබඳ වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බවයි. වාර්තාවක් කියන්නේ, සොයා ගැනීම් කරුණු සහ අදාළ සාක්ෂියි. එහෙත් එවැනි කිසිදු වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරුණේ නැහැ. සිදු කළේ වාර්තාවක් නොමැතිව, සොයා ගත් කරුණු පමණක් ඉදිරිපත් කිරීමයි. සාක්ෂි ටික ඉදිරිපත් කරලා පසුව තමයි ඒ වාර්තාව ලැබුණේ. මෙය 78අ.(6) දරන ස්ථාවර නියෝගය සම්පූර්ණයෙන්ම උල්ලංඝනය කිරීමක්.

මේ කාරණය නැවත වරක් ජනවාරි 10වැනි දා පාර්ලිමේන්තු න්‍යාය පුස්තකයට ඇතුළත් කෙරුණු අතර 2013 ජනවාරි 10 සහ 11 යන දිනවල න්‍යාය පත්‍රයේ අංක 1 යටතේ දක්නට ලැබුණා. 2013 ජනවාරි 10 සහ 11 දිනවල න්‍යාය පත්‍රයේ ඇතුළත් කෙරුණු යෝජනාව 2012 නොවැම්බර් 06වැනි දා පාර්ලිමේන්තු න්‍යාය පුස්තකයට ඇතුළත් කෙරුණු අංක 20 දරන යෝජනාවමයි. ඉන් ප්‍රකාශිත වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107. (3) සහ 107. (2) ව්‍යවස්ථා යටතේ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කළ යුතු බවට වූ යෝජනාවයි. එකම යෝජනාවයි ඉදිරිපත් වුණේ. තේරීම් කාරක සභාවක් පත් කරන්නත්, එසේ පත් කරලා වැරැදිකරුවකු වුණොත් එම ධුරයෙන් ඉවත් කරන්න කියන යෝජනාවයි ඉදිරිපත් වුණේ. "මේ මේ හේතු උඩ ඉවත් කළ යුතුයි" කියන කාරණය යෝජනාවේ තිබුණේ නැහැ.

මෙම අවස්ථාවේ දී මේ කටයුත්ත සඳහා නිවැරැදි ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතු යයි පෙන්වා දුන් අතර ස්ථාවර නියෝග 78අ. සංශෝධනයකොට විවාදය වෙත යොමු විය හැකි යයිද පැහැදිලි කළා. එහෙම නම් කරන්න තිබුණේ ස්ථාවර නියෝග 78අ. සංශෝධනය කරන්නයි. එහෙත් එය සිදු කළේ නැහැ. ඒ වෙනුවට රජය කළේ තේරීම් කාරක සභාවේ සොයා ගැනීම් පදනම් කර ගනිමින් විවාදය පැවැත්වීමයි. මෙහිදී පැහැදිලි කළ යුත්තේ ජනවාරි 10වැනි දා න්‍යාය පත්‍රයට ඇතුළත් කර

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

තිබුණේ අග්‍ර විනිශ්වයකාරතුමිය ඉවත් කිරීම සඳහා පාර්ලිමේන්තුව වෙතින් අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කිරීමට සැලසුම් කෙරුණු යෝජනාවක් හෝ මෝසමක් නොවන බවයි. එය හුදෙක්ම පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කිරීම සඳහා කෙරුණු යෝජනාවක් පමණයි. එම යෝජනාව අවසානයේ මෙසේ සඳහන් වුණා.

"එබැවින්, ඉහත සඳහන් විෂමාචාර චෝදනා හේතුවෙන්, එම විෂමාචාර චෝදනා පිළිබඳව පරීක්ෂාකර එම චෝදනා එකක් හෝ එයට වැඩි ගණනක් ඔප්පුවී ඇතැයි විශේෂ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබුවහොත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍ර විනිශ්වයකාර පදවියෙන්, ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීම සඳහා යෝජනාවක් අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කළ හැකි වන පරිදි පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි ඉහත නම් සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 (3) ව්‍යවස්ථාව සමග කියැවෙන 107 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන සහ, 78 අ දරන පාර්ලිමේන්තු ස්ථාවර නියෝග ද ප්‍රකාරව යෝජනා කර සිටිමු."

එම නිසා ජනවාරි 10, 11 දිනවල පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරුණු යෝජනාව හුදෙක්ම පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කිරීමට කෙරුණු යෝජනාවක් පමණයි. පසු බිම විතරයි මා කියවන්නේ, දැනුම් දෙන්නේ, විස්තර කරන්නේ, ගරු කථානායකතුමනි.

විනිශ්වයකාරවරයකු ඉවත් කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107. (2) ව්‍යවස්ථාවට අනුව අයථා හැසිරීම හෝ තනතුරේ කටයුතු කිරීමට නොහැකි වීම යන කරුණුවලට එම යෝජනාව අදාළ වන්නේ නැහැ. විපක්ෂයේ මන්ත්‍රීවරු ගණනාවක් මේ පිළිබඳ කථානායකවරයාගේ අවධානය යොමු කළා.

"න්‍යාය පත්‍රයේ සඳහන් කරුණු අප සැලකිල්ලට ගෙන ඡන්දය විමසා එය සම්මත වුවහොත් අපට තවත් තේරීම් කාරක සභාවක් පත් කර ගන්නට සිදුවෙනවා. හේතුව මේ යෝජනාව තේරීම් කාරක සභාවක් පත් කිරීම සඳහා ඉදිරිපත් කළ එකක් වීමයි. ජනාධිපතිතුමාගේ අවධානයට යොමු කළ හැකි යෝජනාවක් ලෙස දක්වා ඇතත් ඒ කොටස ක්‍රියාවට නැංවිය නොහැකියි. ක්‍රියාත්මක කළ හැකි එකම කොටස වන්නේ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කිරීමට අප තීරණය කිරීමයි." (648වන කොලම, පාර්ලිමේන්තු විවාද, වෙළුම 214 අංක 4 - 2013 ජනවාරි 11 වැනි සිකුරාදා හැන්සාඩ් වාර්තාව.)

ගරු කථානායකවරයා එදින සභා වාරය ප. ව. 7.34 දක්වා කල් දැම්මා, මේ ගැන සාකච්ඡා කරන්න. ඉන් අනතුරුව රැස්වීම ආරම්භයේදී එතුමා පාර්ලිමේන්තුවට දැන්වූයේ සභාව සාකච්ඡාවට භාජන කර ඇති න්‍යාය පත්‍රයේ අංක 1 යටතේ සඳහන් යෝජනාවට මෙය ප්‍රමාණවත් බවයි. (651 කොලම) ඒ අනුව යෝජනාව සඳහා ඡන්ද විමසීමක් කැඳවූවා. එය පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කිරීම සඳහා ඉදිරිපත් කෙරුණු යෝජනාවක් පමණයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 155 දෙනෙකුගේ ඡන්දයෙන් එය සම්මත වූ අතර 49 දෙනෙකු විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළා.

මෙහිදී කථානායකතුමා ගත් තීරණය පිළිබඳව මා විවේචනය කරන්නේවත්, හැප්පෙන්නේවත් නැහැ. මොකද, එතුමා මේ ගරු සභාවේ සිටියේ නඩුකාරවරයකු හැටියට නීතිය මොකක්ද කියා කියන්න නොවෙයි. න්‍යාය පත්‍රයේ සඳහන් අංක 1 යෝජනාව සම්බන්ධයෙන් මෙය අදාළද, නැද්ද? අංක 1 යෝජනාවේ වැරැද්දක් තිබෙන එක එතුමාට විසඳන්න බැහැ. එය විසඳන්න තිබෙන්නේ වෙනත් ස්ථානයකදීයි. එතුමාට තිබුණේ, අංක 1 යෝජනාව සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 78අ. (1) යටතේ කාරක සභාවක් පත් කර ගන්නයි. ඒකට මේක සම්පූර්ණයි. එහෙම නම් ඒ වුවමනාව ඉටු වෙලා තිබෙනවා. මමයි මේ ප්‍රශ්නය ගත්තේ. මම කියන දේ බැලුවා නම් ඔබතුමාට නඩු අහන්න වෙන්නේ. නඩු අහන්න බලය ඔබතුමාට නැහැ. ඔබතුමා සිදු කළ දෙය එයට අදාළයි, ඒ ගැන මගේ ප්‍රශ්නයක් නැහැ. මම ඔබතුමා සමඟ ඒකට එකඟ වෙනවා.

මෙම ක්‍රියාදාමය නිසි අයුරින් සිදු වූවා නම්, ඊළඟ පියවර විය යුතුව තිබුණේ ස්ථාවර නියෝග 78අ.(7) අනුව පාර්ලිමේන්තුව වෙනුවෙන් කථානායකවරයා විසින් ජනාධිපතිවරයා වෙත යොමුවක් ඉදිරිපත් කිරීමයි. නමුත් මේක අනුව එතුමාට සිදු වුණා ඒ සම්මත වුණු යෝජනාව එවන්න. මෙයද සිදු වූ බවක් පෙනෙන්නට තිබුණේ නැහැ. එය සිදු කිරීමට නොහැකි වූයේ විවාද කොට සම්මත කර ගත්තේ තේරීම් කාරක සභාවක් පත් කර ගැනීම සඳහා දෙවැනි වරටත් ඉදිරිපත් කර තිබූ යෝජනාවක් නිසායි.

යෝජනාවේ සිරස්තලය අනුව එය ඉවත් කිරීමේ යෝජනාවක්. කථානායකතුමා ඒ වැඩ කටයුත්ත කළා. ඒක ජනාධිපතිට එව්වා.

2013 ජනවාරි 11වෙනි දා කථානායකතුමා විසින් ජනාධිපතිතුමා වෙත යොමු කරන ලද ලිපියේ සඳහන් වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107වෙනි වගන්තිය හා ස්ථාවර නියෝග 78අ.(2) අනුව මෙය සම්මත කර ගත් බවයි. අනුගමනය කළ ක්‍රමවේදය එයයි. එහි ස්ථාවර නියෝග 78අ.(7) පිළිබඳව කිසිදු සඳහනක් නැහැ. ඇත්තෙන්ම මේ ලිපිය සභාවේ කටයුතු සිදු වූ ආකාරය පිළිබඳව සැබෑ පිළිඹිබුවක්. It is a true and accurate record of what happened in the House.

ඒක බලා ක්‍රියා කළාම කථානායකතුමාගේ වැඩ කොටස එතැනින් අවසානයි. සභාවේ අපටත් ඡන්දය දෙන්න කිව්වා. සමහර අය පක්ෂව ඡන්දය දුන්නා, සමහර අය විරුද්ධව ඡන්දය දුන්නා. අපි විරුද්ධව ඡන්දය දුන්නා. ඔබතුමන්ලා සමහර දෙනෙක් පක්ෂව ඡන්දය දුන්නා. මෙතැන තිබෙන්නේ ඒ කරුණු දිහා බලා වැරදිකාරියද නැද්ද කියලා තීරණය කිරීම නොවෙයි, ඒ යෝජනාව අදාළ විධියට සකස් වුණාද, නැද්ද කියන එකයි. මේ සභාවේ අපි හැම කෙනාම අපේ යුතුකම් කරලා තිබෙනවා.

මේ අනුව බලන විට මුළු දෝෂාභියෝග ක්‍රියාදාමයම දෝෂ සහගතයි. සමස්ත ක්‍රියාවලියේම කිසිදු වලංගු භාවයක් තිබුණේ නැහැ. ඒ නිසා එළැඹිය හැකි එකම අවසන් නිගමනය වන්නේ අග්‍රවිනිශ්වයකාර ආචාර්ය ශිරානි බණ්ඩාරනායක මහත්මියට එරෙහි දෝෂාභියෝගය හෝ එතුමිය තනතුරෙන් ඉවත් කිරීම කිසිසේත් වලංගු නොවන බවයි.

ඇත්ත වශයෙන්ම මේක ජනාධිපති කාර්යාලයට ගියාම, ජනාධිපතිතුමාගේ උපදේශකයන්ට තිබුණා මේ දිහා බලලා මේක දෝෂාභියෝගයක්ද නැද්ද කියලා කියන්න. ස්ථාවර නියෝග 78අ.(7) යටතේ දෝෂාභියෝගයක් නොවේ නම් විකල්ප තුනක් තිබුණා.

ඉන් එක විකල්පයක් තමයි, ආපසු මේ සභාවට එවීම දෝෂාභියෝගයක් හැටියට ගන්න. දෙවෙනි එක තමයි, මේ ස්ථාවර නියෝගය සංශෝධනය කරන්න කියලා සභාවට කීම. ස්ථාවර නියෝග 78අ.(7) මෙතැනට බලපාන්නේ නැහැ කියලා කිව්වා නම් මේක දෝෂාභියෝගයක් විධියට සලකන්න පුළුවන්. එහෙම නැත්නම් තිබුණේ, දෝෂාභියෝගයක් නොවෙයි කියලා මේක ප්‍රතික්ෂේප කිරීම. නීතිවේදී සංගමය සහ අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මේ ගැන බලලා තීරණයක් අරගෙන තිබෙනවා. ඉන් පසුව ඔබතුමා හිතන්න ඊළඟ පියවර කුමක්ද කියලා.

මේ විග්‍රහය අනුව, එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ක්‍රියා කර ඇත්තේ අග්‍රවිනිශ්වයකාර ශිරානි බණ්ඩාරනායක

මහත්මිය ඉවත් කිරීම සම්බන්ධ පාර්ලිමේන්තුවේ සිදු කෙරුණු ප්‍රකාශයන් පදනම් කර ගනිමිනුයි. මෙම විග්‍රහය අනුව කෙසේ වෙතත් අග්‍රවිනිශ්චයකාර ආචාර්ය ශිරානි බණ්ඩාරනායකගේ අයථා ක්‍රියා කලාපය හෝ වෙනයම් දුබලතාවක් උඩ එතුමිය තනතුරෙන් ඉවත් කිරීම සඳහා පාර්ලිමේන්තුවේ වැඩි දෙනෙකුගේ ඡන්දයෙන් සම්මත වූ කිසිදු ඇමතුමක් කිසිදා ජනාධිපතිතුමාට ඉදිරිපත් නොවූ බව පැහැදිලියි.

තුනෙන් දෙකක ඡන්දයෙන් යෝජනාවක් සම්මත වුණා. ඒ යෝජනාව දෝෂාභියෝගයක් බවට පත් වන්නේ නැහැ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107.(2) ව්‍යවස්ථාවේ නියෝගයන් හැදෑරීමේදී පෙනී යන්නේ අග්‍රවිනිශ්චයකාරතුමිය ඉවත් කිරීමට ජනාධිපතිවරයා නීති විරෝධි හා හිතුවක්කාරි තීරණයක් ගෙන ඇති බවයි.

මේ කරුණු සලකා බැලීමේදී එවකට අමාත්‍ය මණ්ඩලයේ නීති උපදේශක වශයෙන් කටයුතු කළ මොහාන් පීරිස් මහතා අග්‍රවිනිශ්චයකාරවරයා වශයෙන් පත් කිරීම බල රහිත ක්‍රියාවක් බව ඉතා පැහැදිලියි. ඒ අවස්ථාවේදී ඔහුට ඒ තනතුර ප්‍රදානය කිරීමට අවශ්‍ය නීත්‍යනුකූල ඇබෑර්තුවක් නොතිබීම ඊට හේතුවයි.

ඇත්ත වශයෙන්ම මෙතැනදී සිදු වුණේ මේකයි. උපදෙස් දෙන කෙනා තමයි ඊට පසුව මේ තනතුර ගත්තේ. එහෙම නැත්නම් වෙනත් උපදෙසක් දෙනවා. එතැනයි තිබුණු ගැටේ, මට පෙනෙන හැටියට. ඒක වැරදියි  කියලා අපේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මට කිව්වොත්, මම ඒකත් පාර්ලිමේන්තුවේදී කියවන්නම්.

ආචාර්ය ශිරානි බණ්ඩාරනායක මහත්මිය නීත්‍යනුකූලව එම තනතුරෙන් ඉවත් නොකෙරුණු අතර, ඒ නිසා එතුමියට නීත්‍යනුකූලව හා ව්‍යවස්ථානුකූලව පත් කෙරුණු අග්‍රවිනිශ්චයකාරතුමිය වශයෙන් අඛණ්ඩව කටයුතු කළ හැකියි.

ඊළඟට, 2015 ජනවාරි මාසයේ 08වෙනි දින පැවැති ජනාධිපතිවරණයේදී ඇති වූ සිද්ධීන් මේකට සම්බන්ධ නිසා දැන් මම ඒ කාරණා මතු කරන්නම්.

ජනවාරි 09වෙනි දින උදේ පාන්දර, හරියටම කිව්වොත් උදේ පාන්දර 4.00ට පමණ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට මා සමඟ සාකච්ඡා කිරීමට අවශ්‍ය වී ඇති බව දැන ගන්නට ලැබුණා. මා එම සාකච්ඡාව සඳහා අරලියගහ මන්දිරයට ගිය විට පුද්ගලයින් ගණනාවක් ජනාධිපතිතුමා අසල සිටිනු මා දුටුවා. දේශපාලනඥයන් සිටියා. අනෙක් නිලධාරින් සිටියා. ඒක ප්‍රශ්නයක් නොවෙයි. ඉන් එක් අයකු වූයේ මොහාන් පීරිස් මහතායි. එතැන කුමක් කරන්නේදැයි මා ඔහුගෙන් විමසූ විට, තමා යම්කිසි උපදේශයක් දීමට පැමිණි බව කියා ඔහු කාමරයෙන් ඉවත්ව ගියා. නමුත් මට ගරු නීතිපතිතුමාගෙන් දැන ගන්න ලැබුණේ ජනාධිපතිතුමාගෙන් පණිවුඩයක් ලැබ පාන්දර 2.30ට පමණ ඔහු අරලියගහ මන්දිරයට පැමිණෙද්දීත්, ජනාධිපතිතුමා හා අනෙක් අයත් සමඟ මොහාන් පීරිස් ද එහි සිටි බවයි. මොහාන් පීරිස් මහතා පසුව මට දුරකථනයෙන් කථා කොට පැවසුවේ සමහර කොටස් ඔහුව ධුරයෙන් ඉවත් කරලීමට උත්සාහ කරන බවයි. නමුත් අග විනිසුරු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉදිරි සියලු තීරණයන් මඟින් රජයට සහාය ලබා දෙන බවත් ඔහු පැවසුවා. මා විතරක් නොවෙයි සාක්කිකාරයන් හැටියට ඉන්නේ. ඒක අධිකරණ ඇමතිතුමාටත් කිව්වා.  ඒක ජනාධිපතිතුමාටත් කිව්වා. සාකච්ඡාවකට අවස්ථාවක් ලබා දෙන මෙන් ඔහු මගෙන් ඉල්ලා සිටියා. තමා ජනාධිපතිතුමන් සමඟ ද සාකච්ඡා කළ බව ඔහු පැවසුවා. එවිට මම පිළිතුරු දෙමින් කියා සිටියේ, අප දෙදෙනා සමඟම සාකච්ඡාවක් පැවැත්වීමේ අවස්ථාවක් ඔහුට සංවිධානය කර දීමට මා සූදානම් බවයි.

ඒ අනුව 2015 ජනවාරි 12වන දා රාත්‍රී 8.00ට, විජේරාම පාරේ ජනාධිපතිතුමාගේ නිවසේදී එතුමා සහ මා සමඟ සාකච්ඡාවක් පැවැත්වීමට මොහාන් පීරිස් මහතාට දින නියම කෙරුණා. එම සාකච්ඡාවට සහභාගී වන ලෙස මා තිලක් මාරපන මහතාට ද ආරාධනා කළා. තිලක් මාරපන මහතා තමයි මොහාන් පීරිස් මැතිතුමාගේ senior. එදින සිය බිරිඳ සහ තවත් දොස්තරවරුන් දෙදෙනකු සමඟ එහි පැමිණි පීරිස් මහතා ඔවුන් අපට හඳුන්වා දුන්නා. හඳුන්වා දීමෙන් පසු අපට සාකච්ඡා කිරීමට ඉඩ කඩ ලබා දී  ඔවුන් ඉවත් වී යතැයි සිතුවද දිගටම රැඳී සිටියා. මොහාන් පීරිස් පැවසුවේ අධිකරණය විධායකය සමඟ සමඟියෙන් කටයුතු කිරීම සහ විධායකයේ සහාය අධිකරණයට ලැබීම යහපත් තත්ත්වයක් බවයි. නීති කටයුතු පමා වීම වළකාලන්නට තමා කළ සේවාව ඔහු පහදා දුන්නා. තමා නීති විද්‍යාලය ප්‍රතිසංස්කරණය කිරීම නිසා යම් යම් බලපෑම්වලට ලක් වූ ඇතැම් නීතිඥයන් තමන්ට එරෙහි විරෝධතා පිටුපස සිටින බව ඔහු තවදුරටත් පැවසුවා. නීතිඥ සංගමයේ බහුතරයක් එතුමා එක්ක ඉන්නවා කියලාත් එතුමා කිව්වා. ඉතින්, මේ ගැන අපට වාද කරන්න බැහැ නේ. මේ අවස්ථාවේදී මා පැවසුවේ නීතිඥ සංගමයේ විධායක කමිටුව හමුවී තත්ත්වය සමාලෝචනය කර ඔවුන්ගේ අදහස් ඔහු වෙත දන්වන බවයි. 2015 ජනවාරි 17වන දා මම නීතිඥ සංගමයේ විධායක කමිටුව හමු වුණා. ඔවුන් එක හඬින් කියා සිටියේ අග විනිසුරු ලෙස මොහාන් පීරිස් කෙරෙහි කිසිදු විශ්වාසයක් නැති බව හා එම පත්වීම නීති විරෝධි බවයි. අග විනිසුරු ආචාර්ය ශිරානි බණ්ඩාරනායක මහත්මියට එරෙහි දෝෂාභියෝගයට කිසිදු විධිමත් නෛතික පසු බිමක් නොමැති බව ද ඔවුන් පැවසුවා. 2015 ජනවාරි 19වන දා අරලියගහ මන්දිරයේදී මා හමු වන ලෙස මම මොහාන් පීරිස්ට දැන්වූවා.

ගරු අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මහතා සහ තිලක් මාරපන මහතා මා සමඟ මේ සාකච්ඡාවට එක් වුණා. ඒ අවස්ථාවේදී මට දැනගන්න ලැබුණේ මොහාන් පීරිස් සිය බිරිඳ සහ දොස්තරවරුන් දෙදෙනෙකු සමඟ අරලියගහ මන්දිරයට පැමිණ ඇති බවයි. එවිට අප උපදෙස් දුන්නේ පීරිස් මහතා පමණක් සාකච්ඡාවට කැඳවන ලෙසයි. සාකච්ඡාවේදී ඔහු ඉල්ලා සිටියේ අප්‍රේල් වනතුරු සේවය කරන්නට අවස්ථාව ලබා දෙන ලෙසයි. රජයට එරෙහි කිසිදු තීන්දුවක් ලබා නොදෙන බවත් ඔහු පැවසුවා. ඔහු තවදුරටත් කිව්වා, ඕනෑ නම් රජයට එරෙහි කිසිම නඩුවක ඔහු වාඩි වන්නේ නැතිව ඉන්නම් කියලා; අප කියන නඩුකාරවරුන් පත් කරන්නම් කියලා. මම නීතිඥ සංගමයේ විධායක සභා රැස්වීමේ මතය ඔහුට දැනුම් දුන්නා. එවිට ඔහු පැවසුවේ ස්විට්සර්ලන්තය වැනි රටක -ජිනීවාහි- තානාපති තනතුරක් ලබා දෙන්නේ නම් ඔහු තනතුර අත් හැර යෑමට සූදානම් බවයි. ඒ වනකොට නීතිවේදීන්, විනිශ්චයකාරවරුන් සහ මොහාන් පීරිස් අතර සට්ටනයක් ඇති වන තැනට ඇවිල්ලායි තිබුණේ. අපි බැලුවේ මොකක් හරි කරලා මේක විසඳාගන්නයි.

ගරු විදේශ ඇමතිතුමා මඟින් එවැනි තනතුරු පුරප්පාඩු ඇතිද යන්න පිළිබඳව සොයා බැලිය යුතු බව මම ඔහුට පැවසුවා. එවැනි පුරප්පාඩු පිළිබඳව දැනුම් දීමෙන් පසු තමා ඉල්ලා අස් වන බවට මොහාන් පීරිස් එකඟ වුණා. බ්‍රසීලයේ සහ වියට්නාමයේ තානාපති තනතුරු පුරප්පාඩුව පවතින බවත්, ඉතාලි තානාපති ධුරය ළඟදීම පුරප්පාඩු වන බවත්, ගරු විදේශ අමාත්‍ය  මංගල සමරවීර මහතා මට දැන්වූවා. මම මේ බව මොහාන් පීරිස්ට දන්වා බ්‍රසීලයේ තානාපති ධුරය නිර්දේශ කළා. මම කිව්වා, අනෙක් පුරප්පාඩුව තිබෙන්නේ වියට්නාමයේ කියා. ඔබතුමා එහේ යන්නේ නැති වේවි කියා හිතුවා. නමුත් ඔහු සෑහීමකට පත් වුණේ නැහැ. මා විජයදාස රාජපක්ෂ මැතිතුමාට මේ ගැන දැනුම් දුන්නා. ඉතාලියේ -රෝමයේ- තානාපති ධුරය සති කීපයකින් පුරප්පාඩු වන බව මොහාන් පීරිස්ට දන්වන්නැයි මම ගරු අධිකරණ ඇමතිතුමාට පැවසුවා. එවැනි තනතුරක් එතුමා ඉල්ලපු ආකාරයට එක සැරේ දෙන්න බැරි වුණා. සති කීපයකින් දෙන්න පුළුවන්. එය මොහාන් පීරිස්ට දැන්වූ බවත්, පිළිතුරක් අපේක්ෂාවෙන් සිටින බවත් ගරු අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ මහතා මට දැනුම් දුන්නා.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

ජනවාරි 21වන දා ජනාධිපති ලේකම්වරයා මටත්, ජනාධිපතිතුමන්ටත් දැන්වූයේ තමන් තානාපති තනතුරක් සඳහා ඉල්ලීමක් නොකළ බව මොහාන් පීරිස් ප්‍රකාශ කළ බවයි. ඉන් පසු ජනාධිපතිතුමාත්, අධිකරණ අමාත්‍යතුමාත්, මමත් මොහාන් පීරිස් මහතාගෙන් ඉල්ලා සිටියේ එදිනම කැබිනට් රැස්වීමෙන් පසු අප හමුවන ලෙසයි. කැබිනට් රැස්වීම පැවත්වෙමින් තිබියදී පස් වරු 5.00ට පමණ මොහාන් පීරිස් ජනාධිපති ලේකම් කාර්යාලයට පැමිණි බවත්, කැබිනට් රැස්වීම අවසන් වෙද්දී ඔහු පිටව ගොස් ඇති බවත් අපට දැන ගන්නට ලැබුණා.

අපි එතුමාට එන්න කිව්වේ පස්වරු 5.00ට. නමුත් කැබිනට් රැස්වීමට ටිකක් වෙලාව ගත වුණා.

ඒ නිසා පසු දා උදෑසන 8.30ට ජනාධිපතිතුමා සහ මා හමු වීමට පැමිණෙන ලෙස ජනාධිපති ලේකම්වරයා මොහාන් පීරිස්ට දැනුම් දුන්නා. මොකද, අපි  බැලුවේ මේ ගැන යම් කිසි තීන්දුවකට එන්නයි. එතුමා තානාපතිකම ගන්නවා නම් අරගෙන ඒ කටයුතු කරන්න. නැත්නම් අපට කරන්න දෙයක් තිබුණේ නැහැ. ඒකයි මම කියන්නේ.

එදින රාත්‍රියේ කිසිම දැනුම් දීමකින් තොරව පීරිස් මහතා සහ මහත්මිය ජනාධිපතිතුමන්ගේ නිවසට පැමිණියා. එහිදී මොකක්ද වුණේ කියලා ජනාධිපතිතුමා මට කිව්වා. ඒ ගැන මම මේ සභාවේ කියන්න යන්නේ නැහැ. එහිදී ජනාධිපතිතුමන් පීරිස් මහතාට දන්වා සිටියේ පසු දා උදෑසන 8.30ට හමු වීම සඳහා වේලාව වෙන් කර ඇති බවයි. ජනාධිපතිතුමාත්, අධිකරණ ඇමතිතුමාත්, මමත් උදෑසන 8.30 වෙද්දි ජනාධිපති ලේකම් කාර්යාලයට පැමිණියා. නමුත් මොහාන් පීරිස් පැමිණියේ නැහැ. උදෑසන 9.15 පමණ වෙද්දී ඔහු සාකච්ඡාව සඳහා නොපැමිණෙන බව අපට ඒත්තු ගියා.

ජනවාරි 26වෙනි දා හැන්දෑවේ නීතිඥ සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් මට දැනුම් දුන්නේ පත් වීම නීත්‍යානුකූල නොවන නිසා මොහාන් පීරිස් වහාම ඉල්ලා අස් විය යුතු බව සහ මේ පත් වීම ජනාධිපතිතුමා යළි සමාලෝචනය කළ යුතු බවයි. ඔවුන් අවධාරණය කළේ නීත්‍යානුකූල ක්‍රමවේදයකින් තොරව ඉවත් කිරීම නිසා තවමත් සැබෑ අග විනිසුරු ශිරානි බණ්ඩාරනායක මහත්මිය බව නීතිඥ සංගමයේ මතය බවයි. ඒ නිසා මොහාන් පීරිස් මහතාගේ පත් වීම කිසිදු නෛතික වලංගුභාවයකින් තොර බවද ඔවුන් පෙන්වා දුන්නා.

මේ වන කොට මොහාන් පීරිස් මැතිතුමා නොපැමිණෙන බව දැනගත්තා. ජ්‍යෙෂ්ඨ ජනාධිපති නීතිඥවරු කිව්වේ "මේක තවත් දුර යන්න දෙන්න එපා. අපි කිව්ව දේ දිහා බලන්න. ඔබතුමන්ලා සහ ජනාධිපතිතුමා ඒ ස්ථාවරයේ ඉන්නවා නම්, මේක වලංගු නැහැ කියලා කියන්න. එහෙම නොවෙයි නම්, පාර්ලිමේන්තුවට දෝෂාභියෝගයක් ඉදිරිපත් කරන්න ඔබතුමන්ලාට සිදු වේවි. එහෙත් අපේ ස්ථාවරය මේකයි. කොහොම හරි මේක දිහා බලා ඊට පස්සේ ඕනෑ තීරණයක් ගන්න" කියායි. මෙතැනදී අධිකරණ ඇමතිතුමාත් ඒකයි කිව්වේ. ඒ ගැන බලන්න තමයි ඊට පස්සේ ජනාධිපතිතුමා සියලු දෙනාම කැඳෙව්වේ.

නීතිපති දෙපාර්තමේන්තුවේ 130වෙනි සංවත්සරය වෙනුවෙන් පැවති නීතිපති සමුළු රාත්‍රී භෝජන සංග්‍රහය සඳහා මොහාන් පීරිස් වෙත යැවූ ආරාධනය ඉවත් කර ගැනීමට සිදු වුණු බව මම දැන සිටියා.

ඒක සිදු වුණේ රජයේ නීතිඥයන් කිව්වා, එතුමා පැමිණියොත් අපි එන්නේ නැහැ කියලා. නීතිවේදී සංගමයත් ඒ වාගේම දැනුම් දීමක් කරලා තිබුණා.

නීතිඥ සංගමය අග විනිසුරු සම්බන්ධයෙන් යෝජනාවක් සම්මත කර ගෙන තිබුණා. 2015 ජනවාරි 9වන දින හිමිදිරියේ මොහාන් පීරිස් අරලියගහ මන්දිරයේ රැඳී සිටීම පිළිබඳව නීතිඥ සංගමය පූර්ණ සැලකිල්ල යොමු කර තිබුණා. මේ ඒ ගොල්ලන්ගේ යෝජනාවේ තිබුණු කරුණු. ඔවුන් ඒ ගැන මගෙන්ද විමසා සැක හැර දැන ගත්තා. ජ්‍යෙෂ්ඨ නීතිවේදින් සහ නීතිඥ සංගමය පැවසූයේ ඡන්ද ගණන් කරමින් තිබෙන අවස්ථාවක අග විනිසුරුවරයා ජනාධිපති අපේක්ෂකයකු සමඟ සිටීම කිසිසේත්ම සුදුසු ක්‍රියාවක් නොවන බවයි. ගරු විදේශ අමාත්‍යතුමා මේ පිළිබඳව කළ පැමිණිල්ල සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දැන් පරීක්ෂණ පවත්වනවා.

විශේෂයෙන් දැන් කෙරෙන පරීක්ෂණවල මොහාන් පීරිස්ගේ නම සමාගම් ගණනාවක් සමඟ ඈඳී තිබෙනවා. රක්නා ලංකා පුද්ගලික සමාගම, ලංකා ලොජිස්ටික්ස් සමාගම ආදියෙහි අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කළා පමණක් නොව, තවමත් ඒවායේ කොටස් හිමිකරුවෙක්. මේ කරුණු ජාතික විධායක කවුන්සිලය මඟින් පත් කළ ඉහළ පෙළේ දූෂණ විරෝධී කමිටුව වෙත ඉදිරිපත් කෙරෙනු ඇති. මේ තත්ත්වයන් රජයේ නීතිඥයන්, අනෙකුත් නීතිඥයන් සහ අධිකරණය අතර මොහාන් පීරිස් පිළිබඳ ගැටුමකට පමණක් නොව, සමස්ත නෛතික පද්ධතියම අර්බුදයකට ඇද දැමීමට හේතු වුණා. ඔහුගේ නීති හා ව්‍යවස්ථා විරෝධී පත් වීම නිසා ආරම්භයේ සිටම එය වලංගු නොවීමට අමතරව අග විනිසුරු නාමය ඔහුගේ ක්‍රියා කලාපයන් නිසා කෙලෙසුණා.

නිවැරදි ක්‍රියා පිළිවෙත වන්නේ අග විනිසුරු ලෙස හිටපු ජනාධිපතිතුමන් විසින් කළ පත් වීම වලංගු නොවන බව මොහාන් පීරිස්ට දැනුම් දීම බව ජාතික විධායක සභාව සහ නීතිපතිවරයා විමසීමෙන් අනතුරුව ජනාධිපතිතුමන් තීරණය කළේ මෙන්න මේ පසු බිම මතයි. මේ ගැන නීති උපදෙස් ලැබුණාට පස්සේ ගත යුතු පියවර මොකක්ද කියලා අපි සාකච්ඡා කළා. එතුමාත් සිතුවේ මේ පත්වීම වලංගු නැහැ කියලායි. එතුමාත් මේ පාර්ලිමේන්තුවේ හිටියා. ප්‍රශ්නය තිබුණේ පාර්ලිමේන්තුවේ නොවෙයි, ඒ යෝජනාව පිළිබඳවයි. ඒ නිසා  අපි ජනාධිපතිතුමාට කිව්වා, මේ ගැන දැනුම් දෙන්න කියලා.

ඒ සමඟම සැබෑ අගවිනිසුරු ශිරාණි බණ්ඩාරනායක මහත්මියට ජනාධිපතිතුමන් විසින් දැනුම් දුන්නේ නීත්‍යානුකූල අගවිනිසුරු ලෙස යළි  රාජකාරි අරඹන ලෙසයි. නීතිඥ සංගමය පසු ගිය වසර දෙකක කාලය පුරා මේ ස්ථාවරය දැරූ බවත්, මොහාන් පීරිස් මහතා  නීත්‍යානුකූල අගවිනිසුරු ලෙස පිළිගැනීම ප්‍රතික්ෂේප කළ බවත් මම මේ අවස්ථාවේදී  සිහිපත් කරන්න කැමතියි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 (2) ව්‍යවස්ථාව පිළිබඳව මේ ගරු සභාවේත් රටේත් අවධානය යොමු කරන්න මා කැමතියි. "ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් විනිශ්චයකාර  ධුරයක් හිස්ව තිබුණ ද ශ්‍රේෂ්ඨාධිකරණයට ක්‍රියා කිරීමට බලය ඇත්තේ ය. තව ද, එවැනි යම් ධුරයක්  හිස්ව තුබූ පමණින් හෝ විනිශ්චයකාරවරයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබූ පමණින් හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් ක්‍රියාවක් නැතහොත් නඩු කටයුත්තක් නිර්බල නොවන්නේය; නිර්බල  වන්නාක් සේ නොසැලකිය යුත්තේ ය."

ඒ නිසා ශ්‍රේෂ්ඨාධිකරණය මඟින්  පසු ගිය වසර දෙකක කාලය තුළ ලබා දුන් නඩු තීන්දු සහ නියෝග සම්බන්ධයෙන් සැකයක් හෝ බියක් ඇති කර ගත යුතු නැත.

යළි සිය රාජකාරි ඇරඹීමෙන් පසුව ආචාර්ය ශිරාණි බණ්ඩාරනායක මහත්මිය 2015 ජනවාරි 29 වන දා සිට සේවයෙන්

විශ්‍රාම යන බව නිවේදනය කළා. ශ්‍රේෂ්ඨාධිකරණයේ සාම්ප්‍රදායික නිල උත්සවයේදී රජයේ නීතිඥයන්, අනෙකුත් නීතිඥයන් ඇතුළු නීති ක්ෂේත්‍රය සම්බන්ධ සියලු දෙනා එතුමිය උණුසුමින් පිළිගත්තා. එතුමියට උණුසුමින් සමු දුන්නා. විශේෂයෙන් ඊයේ මතු කළ රීති ප්‍රශ්නය ගැන මම කියන්න කැමැතියි. ඒ ගැන වාදයක් නැහැ. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන දෝෂාභියෝගයකින් පස්සේ තමයි ජනාධිපතිතුමාට අග්‍රවිනිශ්චයකාරවරයා හෝ විනිශ්චයකාරයෙක් ඉවත් කරන්න පුළුවන්කම තිබෙන්නේ. නමුත් මෙතැනදී විශේෂයෙන් ජ්‍යෙෂ්ඨ නීතිඥයන් ඇතුළු ඔක්කෝම අය දැනුම් දුන්නේ එහෙම දෝෂාභියෝගයක් ඉදිරිපත් කරලා තිබුණේ නැහැ කියලායි. එදා මේ සභාවේ සිදු වුණු දේ ගැන අපි එක ස්ථාවරයක් ගත්තා. අපි මේ සභාවේදී ඡන්දය දුන්නා. ඔබතුමාත් කිව්වේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරවයි මේ යෝජනාව දුන්නේ කියලා. ඒ අනුව තමයි ජනාධිපතිතුමාට තීරණයක් කරන්න වුණේ මේ දෝෂාභියෝගය නීත්‍යනුකූල ද නැද්ද කියලා. නීත්‍යනුකූල නම් අපට සිද්ධ වෙනවා, මේ සභාවට ඇවිත් යෝජනාවක් ඉදිරිපත් කරලා, ඒ අනුව ඔබතුමා මාර්ගයෙන් කමිටුවක් පත් කරලා යළිත් කාරණා අහන්න.

තව කාරණයක් තිබෙනවා. අද වෙනකොට නීතිඥ සංගමයේ සියලු දෙනාම - සියයට සියයක්- මේ ස්ථාවරයේ ඉන්නේ. එහෙම දිගටම කටයුතු කළා නම් විශාල හැප්පීමක් වෙනවා. [බාධා කිරීමක්] සියයට 90ක්. මමත් නීතිඥවරයෙක් නිසායි මම කියන්නේ. අපි ඒ කරුණු දන්නා නිසා. ඒ අය අප හම්බ වෙන්න ආවා. එතුමා වෙනුවෙන් කවුරුත් හිටියේ නැහැ. කවුරුත් හිටියේ නැහැ. මම පුදුම වුණා. එතුමාගේ යාළුවෝත් කියනවා එතුමා ඉන්න හොඳ නැහැ කියලා. මම දන්නවා නේ එතුමාගේ යාළුවෝ. ඒ තත්ත්වය තමයි තිබුණේ. ඒ විධියට විශාල හැප්පීමක් තිබුණා. එක අතකින් නීතිඥයන් විනිශ්චයකාරවරුන්, මොහාන් පීරිස් මැතිතුමා අතර ප්‍රශ්නයක් ඇති වෙලා. මේකට කොහොම ද ආණ්ඩුව මැදිහත් වෙන්නේ? මේක අපේ ප්‍රශ්නයක් නොවෙයි. මේ සභාවේ කරුණු එකක්වත් මම ප්‍රශ්න කරන්න යන්නේ නැහැ. මම සභාවේදී වාද කළා. මේවා වැරදියි කිව්වා. අපි කළ එක හරි. ඒ යෝජනාවේ තිබුණා දෝෂයක්. ජනාධිපතිතුමාගේ කාර්යාලයට තිබුණා මේ ගැන සොයා බලන්න. ඒ ගැන සොයා බලන්න බැරි වුණේ උපදේශක ඒ තනතුරට පැන්න නිසා.

චන්ද්‍රිකා කුමාරතුංග හිටපු ජනාධිපතිතුමියට එච්ච පණිවුඩ මොනවාද කියලා සොයා ගන්න. එතකොට පෙනෙයි මොකක්ද වුණේ කියලා. එහෙම වුණා නම් තීරණයක් ගන්න පුළුවන් වෙයි ඔබ සියලු දෙනාම හිරේ දාන්න පුළුවන් කියලා. එහෙම වුණා නම්, ඒකත් සිද්ධ වෙනවා. අපට එහෙම කරන්න වුවමනා නැහැ. අපි මෙතැනට ආවේ මේ රටේ අධිකරණය ගැන ස්වාධීනව ක්‍රියා කරන්න. මේ ආණ්ඩුවට විරුද්ධව තීරණ දෙන්න. ආණ්ඩුවට විරුද්ධ තීරණ දෙන්නේ නැත්නම් මේ ආණ්ඩුව දැනුමෙන්ම පිරුණු එකක්. නැත්නම් අපට යටත් වෙන්න ශ්‍රේෂ්ඨාධිකරණයක් තිබෙනවා. ඒක අපට වුවමනා නැහැ. කොහොම හරි මේ තත්ත්වය ඇති වුණු නිසා ඒ තීරණ ගත්තේ.

මා දීර්ඝ කථාවක් කළා. මේ කරුණු සොයා ගන්න වුවමනා වෙයි. සමහර අය ගිහින් මොහාන් පීරිස් මැතිතුමාගෙන් අහයි මේ කරුණු කිව්වා ද නැද්ද කියලා. ඒ කරුණු ඔක්කෝම වුණත් ගෙනෙන්න. අපි ලෑස්තියි විවාද කරන්න. මේක රීතියට සීමා වුණු එකක් නොවෙයි. කරුණාකරලා මොහාන් පීරිස් මැතිතුමාටත් මේ කරුණු පෙන්වලා, කරුණු අහගෙන ඇවිල්ලා [බාධා කිරීම්] අපි ලෑස්තියි. ඕනෑ තරම් ලෑස්තියි. අපි ලෑස්තියි. [බාධා කිරීම්] ඔක්කෝම එක්ක. [බාධා කිරීම්] ඔබතුමා දැක්කේ නැහැ නේ. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, අපි මේ විවාදයට ලෑස්තියි. අපට මේ විවාදය ඕනෑ- [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නිශ්ශබ්ද වෙලා සභාවේ ඉතුරු වැඩ ටික කර ගෙන යමු. [බාධා කිරීම්] තව කථා කරන්න කරුණු තිබෙනවා. ඇහුම්කන් දෙන්න. [බාධා කිරීම්] ගරු අග්‍රාමාත්‍යතුමා කථා කරන්න. [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, මෙතැනදී එකක් කියන්න ඕනෑ. [බාධා කිරීම්] ඔබතුමාත්, මේ සභාවත් ආරක්ෂා වෙනවා. මම ඒ වැඩ කටයුතු කරලා තිබෙනවා. ඉතුරු අය ගැන වාද කරන්න ඕනෑ නම්, ඕනෑ තරම් කරුණු තිබෙනවා. ඕනෑ තරම් ඒවා ගෙනෙන්න පුළුවන්. අපි දැන් මුණගැහිලා ඒ සඳහා වෙලාවක් දමා ගනිමු; දිනයක් යොදා ගනිමු. අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. ඔබතුමන්ලාගෙන් එක ඉල්ලීමක් කරන්න තිබෙනවා. කරුණාකරලා මගේ කථාව අරගෙන ගිහිල්ලා මොහාන් පීරිස් මැතිතුමාට පෙන්වලා, ඒ සාක්ෂි ඇතිව ඇවිල්ලා කථා කරන්න. [බාධා කිරීම්]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Nimal Siripala de Silva-Leader of the Opposition)
ගරු කථානායකතුමනි, අද දින දවල් දොළහ හමාරට මේ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා පක්ෂ නායක රැස්වීමක් කැඳෙව්වා. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
කරුණාකරලා නිශ්ශබ්ද වන්න. [බාධා කිරීම්] දැන් වාඩි වෙන්න. [බාධා කිරීම්]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එම පක්ෂ නායක රැස්වීම පැවැත්වීමට අපට බැරි වුණු නිසා, ඒ අවස්ථාවේදී, -[බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විපක්ෂ නායකතුමායි දැන් කථා කරන්නේ. අතාවුද සෙනෙවිරත්න මන්ත්‍රීතුමා, සුජීව සේනසිංහ නියෝජ්‍ය ඇමතිතුමා, කරුණාකරලා වාඩි වෙන්න. විපක්ෂ නායාකතුමා විතරයි කථා කරන්නේ. [බාධා කිරීම්] කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමාත් වාඩි වෙන්න.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඒ අවස්ථාවේදී ඔබතුමා තීරණය කළා, ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය අවසන් වූ වහාම සභාව කල් තබලා පක්ෂ නායක රැස්වීමක් පැවැත්විය යුතුයි කියලා. ඒ අනුව මම ඉල්ලා සිටිනවා, ඒ පක්ෂ නායක රැස්වීම දැන් පැවැත්විය යුතුයි කියලා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු විපක්ෂ නායකතුමනි, ඊට පස්සේ අපි මේ පනත් කෙටුම්පත සම්මත කර ගනිමු. අපට ඒක EU එකට ගෙන යන්න තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපට ඒක කලින් කර ගන්න පුළුවන් නේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
No, we will meet and come back.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම නම්, සභාවේ කටයුතු විනාඩි 20කට අත් හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා 3.05ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 3.05 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 3.05 p.m. and then resumed.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්න - ගරු සුසන්ත පුංචිනිලමේ මහතා.

## වරප්‍රසාද : කාර්යාලය වටලා සීල් තැබීම
## சிறப்புரிமை: காரியாலயம் சுற்றிவளைக்கப்பட்டு 'சீல்' வைக்கப்பட்டமை
## PRIVILEGE : RAIDING AND SEALING OF OFFICE

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු කථානායකතුමනි, ත්‍රිකුණාමලය පොලීසියේ අයුතු මැදිහත්වීම මත මගේ මන්ත්‍රී වරප්‍රසාද කඩ වීමක් සම්බන්ධයෙනුයි ඔබතුමාට මම මේ පැමිණිල්ල කරන්නේ. මා වසර 20කට වැඩි කාලයක් පාර්ලිමේන්තුවට මහජන ඡන්දයෙන් තේරී පත් වූ මන්ත්‍රීවරයෙක් වශයෙන් -දැනට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් වශයෙන්- කටයුතු කරනවා. මගේ කාර්යාලය පවත්වාගෙන යනු ලබන්නේ චීනවරාය, සමනල මාවත අංක 49/1 දරන ස්ථානයේයි. මන්ත්‍රීවරයෙක් වශයෙන් මා වෙත හිමි වී ඇති දුරකථන, ඒ වාගේම මහජනතාවට සේවය ඉටු කිරීමේදී අවශ්‍ය වන සියලු ලිපිද්‍රව්‍ය, මගේ පරිභෝජනය සඳහා පෞද්ගලිකව මා විසින් මිලට ලබා ගෙන තිබෙන සහල්, පරිප්පු, සීනි වාගේ දේවලුත් ඒ ස්ථානයේ තමයි තිබෙන්නේ. පසු ගිය 23වැනි දින පොලීසියේ 25ක, 30ක පමණ පිරිසක් සෝදිසි වරෙන්තුවක් අරගෙන ඇවිල්ලා, කාර්යාලය වට ලා සීල් තබා තිබෙනවා. අද වනකොටත් පොලීසියට මේ කරුණු ඔප්පු කර ගන්න බැරි වෙලා තිබෙනවා.

ඊයේ දිනයේ උසාවියට ගිහින් මහෙස්ත්‍රාත්තුමා හමු වුණායින් පසුව, මහෙස්ත්‍රාත්තුමා පොලීසියට කියා තිබෙනවා, "බඩුත් උසාවියේ නැත්නම්, පොලීසියට ඒවා ගෙනිහිල්ලාත් නැත්නම් ඒවා නිදහස් කරන්න මගෙන් අහන්නේ මොකටද? තමුන්ම ඒ වැඩේ කරන්න" කියා. නමුත් මහජන දිනය පවත්වන්නවත් අද වන තුරුත් මට ඒ කාර්යාලයේ ඉඩ ලබා දීලා නැහැ.

ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන් මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ වරප්‍රසාද කඩ කර තිබෙන්නේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය භාරව කටයුතු කරන නියෝජ්‍ය පොලිස්පති ජයසේකර නමැති පුද්ගලයායි. ඒ පුද්ගලයන් තමයි එක එක්කෙනාගෙන් ලකුණු දමා ගැනීමට මෙවැනි කටයුතු සිදු කරන්නේ. අපට පරිභෝජනය කරන්න, අපි සල්ලි දීලා ගත්තු භාණ්ඩ මේ විධියට අත් අඩංගුවට අරගෙන අපට හිරිහැර කරන එක යහ පාලනයේ එක ලක්ෂණයක්ද කියා මම අහන්න කැමැතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ලියා දුන්නු එක කියෙව්වාම ප්‍රමාණවත්.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
විශේෂයෙන්ම මේ වාතාවරණය තුළ මට ඡන්දය දුන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජනතාවට සේවය කිරීමට අපහසු තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වා දෙපාර්තමේන්තු මට්ටමෙන් ඒ අයට අවශ්‍ය කරන උපදෙස් ලබා දීලා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් මහජනතාවට නිදහසේ සේවය කිරීමට මට අවස්ථාව සලසා දෙන ලෙසත්, මේ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා, වග කිව යුතු අයට නීතිමය වශයෙන් දඬුවම් ලබා දෙන ලෙසත් මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. අදාළ -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඔබතුමා පාර්ලිමේන්තුව මොහොතකට කල් දැම්මා, විරුද්ධ පක්ෂ නායකතුමාත්, අපි කවුරුත් කරපු ඉල්ලීම අනුව. අග්‍රාමාත්‍යතුමාගේ කථාව පිළිබඳව අපි විවාදයක් ඉල්ලා සිටියා. විවාදයට එකඟ වුණා; විපක්ෂ නායකතුමා ඒ බව සඳහන් කළා. ඒ අනුව විවාදයක් පටන් ගැනීමට ඉඩ ප්‍රස්ථාව සලසා දීම ගැන අපට තවම පැහැදිලිතාවක් නැහැ. ඔබතුමා පාර්ලිමේන්තුව තාවකාලිකව කල් තැබුවේ මේ ප්‍රශ්නය විසඳා දීම සඳහායි. නමුත් ඒ ප්‍රශ්නය විසඳී නොමැති වීම ඉතාම බරපතළයි, ගරු කථානායකතුමනි.

අග විනිසුරුගේ කාරණය සම්බන්ධයෙන් අපේ මන්ත්‍රීවරු, පක්ෂ නායකයන් රාශියක් කථා කිරීමට නියමිතයි. මොකද, අග්‍රාමාත්‍යතුමා කිව්වා වාගේ පාර්ලිමේන්තුව යෝජනාවක් සම්මත කර තිබෙනවා. ඒක අග්‍රාමාත්‍යතුමාත් පිළිගන්නවා. ඒ සම්මත කරන ලද යෝජනාව පාර්ලිමේන්තුව විසිනුයි කර තිබෙන්නේ. ගරු කථානායකතුමා එහි අත්සන් තබා තිබෙනවා. යෝජනාව

යවා තිබෙනවා. මේක පාර්ලිමේන්තුව සම්බන්ධ ප්‍රශ්නයක් නිසා අපි යළිත් වරක් ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා. විපක්ෂ නායකතුමා යෝජනා කළා, අද දින පැයකට හෝ මේ විවාදය පවත්වා 2වැනි දාට අපට කාල වේලාව ලබා දෙන්නය කියා.

රටේ ප්‍රධාන ප්‍රශ්නයක් ගැන පාර්ලිමේන්තුව හැසිරෙන්නේ මර්දනයට පාර්ලිමේන්තුව යටත් කිරීමට නම් අපට නම් ඒක අනුමත කරන්න බැහැ; ඊට එකඟ වෙන්නත් බැහැ. මේක පාර්ලිමේන්තුව පිළිබඳ ප්‍රශ්නයක්. අග්‍රාමාත්‍යතුමා විපක්ෂයේ සිටි කාලයේදී අපි එතුමාට හැම තිස්සේම වෙලාව ලබා දුන්නා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා සභානායකතුමා හැටියට, මම ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා හැටියට හැමදාම ඉල්ලන විවාදවලට කාල වේලාව දුන්නා. ඇයි මේ? [බාධා කිරීමක්] මේ ප්‍රශ්නය ප්‍රධානතම ප්‍රශ්නයක්; ලංකාවේ කවදාවත් මතු නොවුණු ප්‍රශ්නයක්, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අමැතිතුමනි. ඔබතුමා අහගන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Plantations and Leader of the House of Parliament)

We are willing.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

You are willing, but you are depriving us. Your willingness is always a big question. You want us to wait for one week. For what? - [*Interruption.*] You did not wait for one week. Give us a debate and we will show that you all did not wait for so many years. You listened to the Hon. Prime Minister's speech; read it if you do not understand it. We respect the Hon. Prime Minister in relation to certain matters, which he admitted were correct. That is what you all are trying to suppress now. So, give us a chance to start the debate. You must, at least, give the Hon. Leader of the Opposition a chance to start the debate.

ගරු කථානායකතුමනි, මෙය මේ ගරු සභාව ඉදිරියේ අපි කරපු ඉල්ලීමක්; සභාවට වුණු පොරොන්දුවක්. ගරු කථානායකතුමාගෙන් අපි ඉල්ලනවා, මේ වැදගත් වූ ප්‍රශ්නය, ගරු අග්‍රාමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද මේ Statement එක, අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය විවාද කරන්නට අපට පළමුවෙන් අවස්ථාව ලබා දෙන්න කියලා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, මා මේ කියන කාරණය කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවන්නට කැමැතියි. ඊයේ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා මතු කළ ප්‍රශ්නයත්, විපක්ෂ නායක ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා මතු කළ ප්‍රශ්නයත් ගැන අද ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශයක් කරනවාය කිව්වා. ඒ වෙලාවේ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉල්ලීමක් කළා, ඒ ප්‍රකාශය ගැන අපට හෙට විවාදයක් දෙන්න කියලා. මමත් ඒ අවස්ථාවේ නැඟිටලා ඒ ඉල්ලීම කළා. ඒ අවස්ථාවේ මට මතකයි, පක්ෂ නායකයන් රැස්වෙලා ඒ ගැන තීරණයක් ගන්න කියලා ගරු අග්‍රාමාත්‍යතුමා මේ සභාවේදී ප්‍රකාශ කළ බව. ඒ අනුව පාර්ලිමේන්තුවේ කැඳවීම මත අපි අද 12.30ට පක්ෂ නායක රැස්වීමට ආවා. ඒ අවස්ථාවේදී ආණ්ඩු පක්ෂය වෙනුවෙන් කිසිම නියෝජිතයෙක් ඒ සාකච්ඡාවට සහභාගි වෙලා සිටියේ නැහැ. ඒ නිසා ඒක සාකච්ඡාවකින් තොරව අවසන් වුණා. ඊට පස්සේ තමයි අපි සභාවට ආවේ.

දැන් ගරු අග්‍රාමාත්‍යතුමා එතුමාගේ ප්‍රකාශය කළා. ඔබතුමාගේ කැඳවීමෙන් අපි ඒ පක්ෂ නායක රැස්වීමට ගියේ, අද දවසේ එතුමාගේ ප්‍රකාශය හා සම්බන්ධ කරුණු සාකච්ඡා කරන්න අවස්ථාව ලැබෙයි කියන විශ්වාසයෙන්. නමුත් අවසානයේ ආණ්ඩු පක්ෂයෙන් ඉදිරිපත් කළේ ඉතා ඈත දින; 9වැනිදා, 10වැනිදා වාගේ දින. අන්තිමට තව දිනයක් යෝජනා කළා. ඒකත් අය වැයත් එක්ක සම්බන්ධ සාකච්ඡාව තිබෙන දවසක්.

ගරු කථානායකතුමනි, අපි කියන්නේ මේකයි. මේ ප්‍රශ්නය මතු වෙලා තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාර ධුරය සම්බන්ධයෙන්. අග විනිසුරුතුමා ඒ ආකාරයට ඉවත් කිරීමට පියවර ගැනීමේ ප්‍රතිඵලයක් හැටියට ඊයේ තවත් සිද්ධියක් සිදු වෙලා තිබෙනවා. නීතිඥ සංගමයේ නීතිඥයන් යයි කියන කණ්ඩායමක් ගිහිල්ලා අළුත්කඩේ උසාවි සංකීර්ණයේ අංක 5 දරන මහේස්ත්‍රාත් උසාවියේ ඉන්න විනිශ්චයකාරතුමාට සෝෂා කරලා, එතුමාට එරෙහිව යම් යම් ප්‍රකාශ කරලා, ඒ විනිශ්චයකාරවරයාත් අයින් වෙන්න ඕනෑ කියන මතයෙන් එතුමාට ඉතා විශාල හිරිහැර කර තිබෙනවා. ඒ උසාවි සංකීර්ණයේ අතිරේක මහේස්ත්‍රාත්වරු අටක්, නවයක් ඉන්නවා. ඒ අටෙන් නවයෙන් එක්කෙනෙක් එතුමා. ඉතින් දැන් මේක ප්‍රවණතාවක් හැටියට යනවා.

විනිසුරුවරුන් එහෙම කෝලාහල කරලා එළවන ක්‍රමයක් තියෙන්න බැහැ. විනිසුරුවරුන් එහෙම විරෝධතා පවත්වලා එළවන ක්‍රමයක් තියෙන්න බැහැ. එතැන- [බාධා කිරීමක්] මට සමාවෙන්න. මට මේක කියන්න ඉඩ දෙන්න ගරු මන්ත්‍රීතුමා. ගරු කථානායකතුමනි, ඊයේ මහේස්ත්‍රාත් උසාවියේ එහෙම වුණා නම් හෙට තව තැනක මේක වෙන්න පුළුවන්. මොහාන් පීරිස් මහත්මයා එම තනතුරට සුදුසු නැත්නම් එතුමාව අයින් කරන විධියක් තිබෙනවා. ඒ විධියට අයින් කිරීම ගැන අපේ කිසි විරුද්ධත්වයක් නැහැ. එතුමා ගැන නොවෙයි, මේ අපි පෙනී සිටින්නේ. අපි මේ පෙනී සිටින්නේ මේ සිදු වී තිබෙන ක්‍රියාවලිය; ඒකෙන් පාර්ලිමේන්තුවට සිදු වී තිබෙන මහා හෑල්ලු වීම; ඒකෙන් අපි අපිවම ප්‍රශ්න කර ගන්නා තත්ත්වයකට පත් වීම කියන කාරණා ගැනයි.

ඒ නිසා ගරු කථානායකතුමනි, අපි ඉල්ලන්නේ මේකයි. ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශයට අපි ඉතා සාවදානව ඇහුම්කන් දුන්නා. එතුමාගේ ප්‍රකාශය පදනම් කර ගෙන අපි අද මේ විවාදය අඩු ගණනේ පැයක් දෙකක්වත් කරලා, සුදුසු දිනයකට කල් දමමු. ඉතාම මෑත දිනයකට කල් දමමු. කරුණාකරලා පාර්ලිමේන්තුවේ අපට මේ පිළිබඳව අදහස් පළ කරන්න තිබෙන අවස්ථාව දෙන්න. මේක අපේ පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. ජාතියක් හැටියට

[ගරු විමල් වීරවංශ මහතා]

මතු වෙලා තිබෙන අවදානමක් ගැනයි අපි මේ කථා කරන්නේ. ඒ නිසා මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකරලා අද අපේ අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්නය කියලා. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සභානායකතුමා, තමුන්නාන්සේගේ අදහස් ඉදිරිපත් කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අපි විවාදයක් දෙන්න සූදානම්. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. අපේ ගරු අගමැතිතුමාත් කිව්වේ අපි දිනයක් දෙන්නම් කියන එකයි. [බාධා කිරීම්] මමත් මේ පාර්ලිමේන්තුවේ අවුරුදු 25ක් ඉඳලා තිබෙනවා. කවදාවත් එදාම විවාදයක් දුන්නේ නැහැ. විවාදයක් ඉල්ලුවාම එකම දවසේ -එදාම- විවාදයක් දෙන්නේ නැහැ. එදාම විවාදයක් දීලා තිබෙනවාද? [බාධා කිරීමක්] කවදාවත් එකම දවසේ විවාදයක් දෙන්නේ නැහැ. අනෙක් කාරණය Committee on Parliamentary Business රැස්වෙලා 5,6 සහ7 දිනවල වැඩ පිළිවෙළ සාකච්ඡා කරලා අවසන් කළා.

ඉතින් ඉල්ලන දවසේම විවාදයක් දෙන්න බැහැ නේ. අපි ඒකට ලෑස්ති වෙන්න ඕනෑ. මේ ප්‍රශ්නය ගැන හැම එක්කෙනාටම කතා කරන්නත් බැහැ. මේ ප්‍රශ්නයේදී නීතිය සම්බන්ධයෙන් ගැඹුරට යන්න ඕනෑ. මේක හදිසියෙන් කරන්න බැහැ. ඕනෑම කෙනෙකුට අපහාස කරන්න පුළුවන්. නමුත් මේක නෛතික ප්‍රශ්නයක්.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
කොහොම හරි දෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කොහොමටවත් එදාම විවාදයක් දෙන්න බැහැ. මට කියන්න එහෙම දීපු එක අවස්ථාවක්. අපි මේ පාර්ලිමේන්තුව තුළ විපක්ෂය හැටියට සිටියදී විවාදයක් ඉල්ලලා, එදාම දුන්නාද? එදාම දුන්නාද? එහෙම දුන්න එක අවස්ථාවක් මට කියන්න. විවාදයක් ඉල්ලුවත් කිසිම දවසක එදාම අවස්ථාව දීලා නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු කථානායකතුමනි, අගවිනිසුරු මොහාන් පීරිස් මැතිතුමා තනතුරින් ඉවත් කිරීමේ කාරණය අද මේ රටේ උණුසුම් මාතෘකාවක් වෙලා තිබෙනවා. මේ කාරණය පිළිබඳව පාර්ලිමේන්තුව කොයි විධියෙන්ද හැසිරෙන්නේ කියන කාරණය අපි රටට ප්‍රකාශ කරන්න ඕනෑ. අපි ඉල්ලන්නේ අද මේ විවාදය පටන් ගන්න අපට අවස්ථාව දෙන්න කියලායි. විවාදය කල් දැම්මාට කමක් නැහැ. විවාදය පටන් අරගෙන කථිකයෙක් දෙන්නෙක් කථා කළාට පස්සේ වෙනත් දිනයකට කල් දමන්න අපි කැමැතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා ඔය යෝජනාව Parliamentary Business Committee එකේදී කළා. අපි පස්වැනි දා පස්වරු හයහමාරට මේ විවාදය ආරම්භ කරන්න සූදානම්. අද බැහැ. [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පස්වැනි දා කල් වැඩියි. අද සවස විවාදය ඕනෑ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අද බැහැ. [බාධා කිරීම්]

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේ සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. මේ වාගේ වැදගත් කාරණයක් ඒ විධියට වෙන්නේ නැහැ. ගරු අග්‍රාමාත්‍යතුමා එතුමාගේ ප්‍රකාශය කළා. ඒ ප්‍රකාශය පිළිබඳවයි අද විවාද කරන්න ඕනෑ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා (ස්වදේශ කටයුතු හා ධීවර අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா - உள்நாட்டலுவல்கள் மற்றும் கடற்றொழில் அமைச்சர்)
(The Hon. M. Joseph Michael Perera - Minister of Home Affairs and Fisheries)
ගරු කථානායකතුමනි, අපි සියලු දෙනාම එකඟ වෙලා අද සම්මත කර ගන්න ඕනෑ පනත් කෙටුම්පතක් තිබෙනවා. ඒක ඉතා හදිසියි. ඒක මුළු රටටම බලපානවා. [බාධා කිරීම්] ඒක අපි සවිස්තරව කථා කළ යුතු පනත් කෙටුම්පතක්. ඒ නිසා මේ පනත් කෙටුම්පත පිළිබඳ විවාදය කල් තබනවාට මම අකමැතියි. මොකද, එහෙම වුණොත් මේ රටේ ධීවරයන් විශාල පිරිසකට ලොකු ප්‍රශ්නයක් මතු වනවා. ඒ ධීවරයන් පාරට බහියි. ඒ නිසා වැදගත් වන්නේ ඒ විවාදයයි. [බාධා කිරීම්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මාළු කන්න කලින් මේ රටේ නීතියක් තිබෙන්න ඕනෑ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අද සාකච්ඡාවට ගන්න තිබෙන්නේ ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත. ඒකට වැදගත්කමක් තිබෙනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, මෙතුමන්ලාට අවශ්‍ය වෙලා තිබෙන්නේ ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කර ගන්නනේ. [බාධා කිරීම්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சர்)
(The Hon. Sajith Premadasa - Minister of Housing and Samurdhi)
ඒ සම්බන්ධයෙන් කථා කරන්න තිබෙනවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

කථා කරලා අවසානයේදී කරන්නේ සම්මත කරන එක නේ. අපේ සම්පූර්ණ සහයෝගය දීලා ඒ පනත් කෙටුම්පත සම්මත කරලා දෙන්න අපි කැමැති වුණා, ගරු කථානායකතුමනි.

අපේ ගරු දිනේෂ් ගුණවර්ධන හිටපු ඇමතිතුමාත්, අනෙකුත් කථිකයෝත් අප මතු කරන කාරණයේ තිබෙන හදිසි අවශ්‍යතාව පෙන්වලා දුන්නා. අද දින පාර්ලිමේන්තුව තුළ ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශයක් කළා. අද රටට යන්නේ එතුමා කළ ඒ ප්‍රකාශය විතරයි. ඒ නිසා අපට අසාධාරණයක් වනවා. ඒකයි අපි කිව්වේ, අඩුම තරමින් අපේ එක් කථිකයෙකුට හරි අද ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්න අවස්ථාවක් දෙන්න කියලා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා හැම වෙලාවේම ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන කෙනෙක් නිසා, එතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා, නම්‍යශීලී වෙලා අද දවසේ එතුමාගේ ප්‍රකාශය පිළිබඳ විවාදය ආරම්භ කිරීමට ඉඩ දෙන්න කියලා. එහෙම බැරිකමක් තිබෙනවා නම්, අපි ඉල්ලා සිටියා අඩුම තරමින් තිබෙන ළඟම දිනය හැටියට පෙබරවාරි දෙවැනි දා ඒ අවස්ථාව ලබා දෙන්න කියලා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, මම ඊයේ ප්‍රකාශ කළා, අද මේ සභාවට ඇවිල්ලා කරුණු පැහැදිලි කරන්නම් කියලා. ඒ වාගේම අද දිනය වෙන් කරලා තිබුණා මේ පනත් කෙටුම්පත විවාද කරන්න. ඒ සඳහා පැය දෙකක් ඉල්ලුවේ බොහෝ දෙනෙකුට කථා කරන්න වුවමනා වුණු නිසා. මම අද ප්‍රකාශයක් කළා. එවැනි ප්‍රකාශයක් කළාට පස්සේ, ඊට පසුව එන දිනයක් යොදා ගන්නා සාමාන්‍ය සම්ප්‍රදාය කවදාවත් කඩලා නැහැ.

විශේෂයෙන්ම මම කාරණා දෙක තුනක් කියන්න කැමැතියි. අපට පුළුවන් මීට පස්සේ තිබෙන පළමු දිනය මේ විවාදය සඳහා යොදා ගන්න. අපේ නිදහස් දිනය තිබෙනවා පෙබරවාරි මස 4 වැනි දා. එම නිදහස් උත්සවය පවත්වන්නේ පාර්ලිමේන්තුව ඉදිරිපිට තිබෙන ක්‍රීඩා පිටියේ. සෙනසුරාදා, ඉරිදා නිවාඩු දවස්. ආපසු දෙවැනි දා තුන්වැනි දා පෙරහුරුව කරන්න කියලා අපි ත්‍රිවිධ හමුදාවට කිව්වා. ත්‍රිවිධ හමුදාවෙන් ඉල්ලා සිටි සම්පූර්ණ දවස් ප්‍රමාණය අපි ඔවුන්ට දුන්නේ නැහැ.

ඒ අනුව, ඇත්ත වශයෙන්ම අපට හෙට සිට පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු කරන්න බැහැ. නවම් පෙරහැර නිසා දෙවැනි දා උදේ වරුවේ කොළඹ සමහර පාරවල් වහනවා. එම නිසා අපට ආපසු රැස්වෙන්න පුළුවන් වෙන්නේ පස්වැනි දා යි. ඒ නිසායි පස්වැනි දා දිනයෙන් කොටසක් මේ විවාදය සඳහා වෙන් කළේ. නැත්නම් අපට කියන්න තිබුණා, සෙනසුරාදා උදේ පාර්ලිමේන්තුව රැස් වෙන්න කියලා. නමුත් හෙට උදේ තමයි සම්පූර්ණයෙන් නිදහස් උත්සවයේ පෙරහුරුව පටන් ගන්නේ. ඒ නිසා දෙවැනි දා සහ තුන්වැනි දා අපේ වාහන එන විධිය, කොළඹින් පිටත් වෙන විධිය සම්පූර්ණයෙන් වෙනස් වෙනවා. නැත්නම් දෙවැනි දා විවාදයට කාලය ලබා දෙන එක ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. එහෙම දුන්නා නම් අපට මෙතැනදී මේ කාරණය සාකච්ඡා කරන්න තිබුණා. අපටත් ඕනෑ ඒ ගැන සාකච්ඡා කරන්නයි. අසාධාරණයක් වෙන්න බැහැ. මගේ ප්‍රකාශය කාටවත් විරුද්ධ එකක් නොවෙයි. තමන් දන්නා හේතු ටික කියලා ඒ ගැන කථා කරන්න. විශේෂයෙන්ම මම එක දෙයක් දැක්කා. විරුද්ධ පක්ෂයේ නායකතුමා බැලුවා, අඩු ගණනේ දෙවැනි දා අවස්ථාව දෙන්න කියලා කියන්න. නමුත් මෙතැන ඉන්න කොටසක් ඒකට කෑ ගැහුවා. එසේ කෑ ගැහුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු නොවෙයි. [බාධා කිරීම්] ඇයි ප්‍රාණ ඇපකරුවන් බවට ගන්න හදන්නේ? තමුන්නාන්සේලා චන්ද්‍රිකා කුමාරණතුංග ඔය පක්ෂයෙන් පැන්නුවා. [බාධා කිරීම්] මෛත්‍රීපාල සිරිසේන ඔය පක්ෂයෙන් පැන්නුවා. දැන් ඔය පක්ෂය නැති කරන්න හදන්න එපා. ඔය පක්ෂය නැති කර ගන්න එපා. කරුණාකරලා තමන්ගේ කණ්ඩායම කැඳවලා, තමන්ගේ කණ්ඩායමෙන් අහන්න මොකක්ද කරන්න ඕනෑ කියලා. [බාධා කිරීම්] තමන්ගේ කණ්ඩායමෙන් අහන්න. [බාධා කිරීම්]

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

අතාවුද සෙනෙවිරත්න මැතිතුමනි, ඔබතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටියේ නැහැ නේ. ඔබතුමා සම සමාජ පක්ෂයේ ඉඳලා පැනපු කෙනෙක් නේ. [බාධා කිරීම්] ඔබතුමා වාඩි වෙන්න. දැනුත් කෑ ගහනවා. වාඩි වෙලා ඉන්න. මම කියන්නේ මේකයි. මම ලෑස්තියි විපක්ෂ නායකතුමාට විවාදය සඳහා අවස්ථාව දෙන්න. ඇයි, මේ පළමුවැනි පේළියේ ඉන්නා අය විපක්ෂ නායකතුමාට කෑ ගැහුවේ? ඇයි අර පේළියේ ඉන්න අය කෑ ගැහුවේ නැත්තේ? මම හිතුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය කෑ ගහයි කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එතැන නැහැ. [බාධා කිරීම්] ඕනෑවට වඩා කෑ ගැසුවොත් මම ඔබතුමා ගැන ජනාධිපතිතුමාට වාර්තා කරනවා. වාඩි වෙන්න, වාඩි වෙන්න. ජනාධිපතිතුමාගෙන් ටොක්කක් කන්නේ නැතුව වාඩි වෙන්න. [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

ජනාධිපතිතුමා අපේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

නිශ්ශබ්ද වන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

ජනාධිපතිතුමා අපේ. [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ඔබේ නායකයා කවුද? ඔබේ නායකයා අපේ ජනාධිපති.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

හරියට හරි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගිහිල්ලා එතුමාගෙන් අහගන්න. ඔබේ පක්ෂයේ නායකයාගෙන් ගිහින් අහන්න මොකක්ද කරන්න ඕනෑ කියලා. ගරු අතාවුද සෙනෙවිරත්න මැතිතුමා වාඩිවෙන්න. මම ලෑස්තියි ඔබතුමාගේ පක්ෂයේ නායකතුමා සමඟ කථා කරන්න. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මුලින්ම ගරු අගමැතිතුමා කියන දෙයට ඇහුම්කන් දීලා, ඊට පසුව කථා කරන්න. එතකොට කියන දෙය පැහැදිලියි.

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අගමැතිතුමා කිව්වා දෙවැනි දා විවාදයට අවස්ථාව දෙන්න පුළුවන් කියලා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මම කිව්වේ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා දැන් කිව්වා දෙවැනි දා දෙන්න පුළුවන්, - [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න කෝ. ඔබතුමා කලබල වෙන්න එපා. දැන් ඔබතුමා කිව්වා,- [බාධා කිරීම්] - පොඩ්ඩක් ඉන්න.

ගරු අගමැතිතුමනි, මම කියන දෙය අහන්න කෝ. මම කියන දෙය වැරදි නම් වැරදියි කියන්න. ඔබතුමා කිව්වා, දෙවැනි දා දෙන්න පුළුවන්, නමුත් හමුදාව නිදහස් දින උත්සවයට පුරුදු වෙනවා කියලා. පාර්ලිමේන්තුව උත්තරීතරයි. හමුදාව පැය දෙක, තුනක් පැත්තකින් ඉඳියි. [බාධා කිරීම්] මේක ගරු කථානායකතුමාගේ බල පරිශ්‍රය. පාර්ලිමේන්තු වටරවුම කියන්නේ ගරු කථානායකතුමාගේ බලය තිබෙන ප්‍රදේශය. Parliament can decide that we sit on the 2nd. Why can we not decide that we sit on the 2nd? Why are you trying to deprive Parliament of sitting on the 2nd?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, අපි සම්ප්‍රදායයක් හැටියට, - [බාධා කිරීම්] Wait till I finish.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මාදිවෙල පැත්තෙනුත් එන්න පුළුවන්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, අපි මෙතැන 1984 අවුරුද්දේ සිට නිදහස් දින උත්සවය පවත්වා තිබෙනවා. ගාලු මුවදොර එම උත්සවය පවත්වා තිබෙනවා. ඇත්ත වශයෙන්ම අපට වැදගත්ම දිනය තමයි අපේ නිදහස් දිනය. දැන් මෙතුමා කියන්නේ නිදහස් උත්සවය පවත්වන්න එපා කියලායි. ඒකනේ කියන්නේ. [බාධා කිරීම්] ඔබතුමා කියන්නේ නිදහස් දින උත්සවය කරන්න එපා කියලායි. බණ්ඩාරනායක, සේනානායක යන මැතිවරුන් ලබා ගත්ත නිදහස් දිනය එපා කියන්නේ සම සමාජයේ අය. එවකට අගමැති ඩී.එස්. සේනානායක මහතා. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා සභානායක. ඒ දිනය එපා කියන්නේ කවුද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයවත්, එක්සත් ජාතික පක්ෂයේ අයවත් නොවෙයි. [බාධා කිරීම්] ඒක එපා කියන්නේ වෙනත් අය. අතාවුද සෙනෙවිරත්න මැතිතුමනි, බණ්ඩාරනායක, සේනානායක ලොකුද, නැද්ද කියලා අපට කියන්න. [බාධා කිරීම්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු අගමැතිතුමා කිව්වා, පාර්ලිමේන්තුව ඉදිරියේ පෙරෙට්ටුවේ පෙරහුරුව තිබෙන නිසා එන්න අමාරුයි කියලා. ඇත්ත තමයි පෙරෙට්ටුවේ පෙරහුරුව පටන් ගත්තොත් මේ පාරෙන් එන්න බැහැ. නමුත් ඒ ඔක්කෝම කෙරෙන්නේ පිට්ටනියේ හා ඒ අවට පාරේ. අපට මාදිවෙල පාරෙන් එන්න ඉඩ හදලා තිබෙන්නේ ඒ නිසායි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම රාජ්‍ය මාර්ගය - State Drive එක - වුවමනායි, ජනාධිපතිතුමාගේ සහ අපේ වාහන ටික එන්න. කථානායකතුමාගේ වාහනය ප්‍රධාන ගේට්ටුවෙන් එන්නේ. තවත් එන වාහන තිබෙනවා. ඒ පාර එදාට වහනවා. මෙතෙක් දවස් වැසුවේ එක කොටසක් විතරයි. ඊළඟ දවස් කීපයේදී මේ පාරේ අනෙක් කොටසත් වහන්න යනවා. ජනාධිපති මන්දිරයේ ඉඳන්- [බාධා කිරීම්] නැහැ, නැහැ. Chopper එකෙන් කියන්නේ? එතුමා ඕනෑ වෙලා තිබෙන්නේ නිදහස් දිනය පහළට දාන්න ද? Chopperවලින් යන ජනාධිපතිවරු මෙහේ නැහැ. දැන් ඉන්නේ ඇවිද ගෙන යන අය. රජ මන්දිරයට යන්නේ- [බාධා කිරීම්] එතැනට විතරයි.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ගරු කථානායකතුමනි, පැය දෙකක් ඇතුළත පනත් කෙටුම්පත සම්මත කරලා දෙනවා. අපි කියන්නේ, "12 වෙනකම්, පැය 5ක් අපට කථා කරන්න දෙන්න" කියලායි. මෙහෙම පාර්ලිමේන්තුවේ වාද විවාද කරලා තිබෙනවා. පෙරහුරුව කර ගන්න හෙටත් පුළුවන්, අනිද්දාත් පුළුවන්. බාධාවක් නැහැ. දිගටම කාලය තිබෙනවා. අපට පැය පහක්, 12 වන තෙක් කාලය දෙන්න ගරු කථානායකතුමනි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබේ නායක- [බාධා කිරීම්]

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
ඔබතුමන්ලාට ඕනෑ- [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ- [බාධා කිරීම්]

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු තිස්ස විතාරණ මන්ත්‍රීතුමා, ඔබතුමා මොකක්ද කියන්නේ?

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
ගරු කථානායකතුමනි, පසු ගිය දිනක අපේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරතුමා එතුමාගේ තනතුරෙන් ඉවත් වන්න පියවරක් හදිසියේ අරගෙන තිබෙන බව අපි දන්නවා. ඒක සුළු දෙයක් නොවෙයි. ඒක අධිකරණයේ අනාගතයට බලපාන දෙයක්. ඒක අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට බලපාන දෙයක්. යහ පාලනය ගැන කථා කරන අය ඒක තේරුම් ගතයුතුයි. මේ අවස්ථාවේදී ගරු අගමැතිතුමා පාර්ලිමේන්තුවට හේතු දැක්වූවා, ඇයි ඒක කළේ කියලා. ඒ මතය විතරයි රටට යන්නේ. ඒක ප්‍රජාතන්ත්‍රවාදයද? ගරු කථානායකතුමනි, විරුද්ධ පක්ෂය හැටියට අපට ඒ සම්බන්ධව යම් අදහසක් ඉදිරිපත් කරන්න අවස්ථාවක් දෙන්න. එපමණයි අපි ඉල්ලන්නේ. විවාදය පටන් ගත්තාට පස්සේ ජනතාවටත් හැඟීමක් එයි, මේ කරලා තිබෙන දේ අපි පිළිගන්නවාද, නැද්ද කියලා. කරුණාකරලා, අඩු වශයෙන් පාර්ලිමේන්තුවේ වුණු සිද්ධියක් සම්බන්ධව අපේ අදහසවත් ඉදිරිපත් කරන්න මේ අවස්ථාව ලබා දෙන්න කියලා ඉතාමත්ම ඕනෑකමින් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විවාදයක් කරනවා නම් Motion එකකින් එන්න ඕනෑ. ඒ නිසා අදහස ඉදිරිපත් කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අපි මුලින්ම කිව්වා, දැන් තිබෙන්නේ අලුත් දේශපාලන සංස්කෘතියක් කියලා. අපේ ජනාධිපති, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති. අපේ ජනාධිපති. [බාධා කිරීම්] අපියි පත් කර ගත්තේ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නිශ්ශබ්ද වන්න. කියන දේ ඇහෙන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපේ ජනාධිපති, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති. මේක අලුත් සංස්කෘතියක්. [බාධා කිරීමක්] අපි එකට වැඩ කරමු. අපි විවාදයකට සූදානම්. නමුත් විවාදය අදම දෙන්න බැහැ. පාර්ලිමේන්තු ඉතිහාසයේ කිසිම දවසක- [බාධා කිරීම්] තමුන්නාන්සේලා ඒක ජනාධිපතිතුමා හමු වෙලා අහන්න කෝ. හෙට ජනාධිපතිතුමා හමු වෙලා අහන්න කෝ, අපි වැරදිද කියලා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
පක්ෂයේ නායකයා හමු වෙන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔව්. පක්ෂයේ නායකයාගෙන් අහන්න කෝ. එතුමා දෙන උත්තරය මොකක්ද?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ඊට පස්සේ එන්න අපිත් එක්ක වාද කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ වැදගත් ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පතට-

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු කථානායකතුමනි, අපේ පක්ෂයේ සභාපතිතුමා, ජනාධිපතිතුමායි. නමුත් අද මේ ප්‍රශ්නය උද්ගත වෙලා තිබෙන්නේ ඒ නිසා නොවෙයි. මේ ප්‍රශ්නය උද්ගත වෙලා තිබෙන්නේ, මොහාන් පීරිස් මහතා ඉවත් කිරීම ගැන ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශයක් කළා. දැන් එම ප්‍රකාශයට සම්බන්ධව අපේ විපක්ෂයේ මතය ප්‍රකාශ කරන්නට ඉඩ ලබා දෙන්නේ නැහැ. මෙය ඉතාම අසාධාරණ ක්‍රියාවලියක්. මොකද? රටට යන්නේ අගමැතිතුමාගේ ප්‍රකාශය පමණයි. මේ සම්බන්ධයෙන් අපි දරන ප්‍රතිවාදී අදහස් ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාවක් ඕනෑ. එම නිසා තමයි අප කියා සිටින්නේ අඩුම තරමේ එක කථිකයෙක් සඳහාවත් අවස්ථාවක් ලබා දෙන්න කියලා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මා කෙටියෙන් සඳහන් කරන්නම්. අතිගරු ජනාධිපතිතුමා තමයි ලිපිය ලියලා තිබෙන්නේ ගරු ශිරානි බණ්ඩාරණායක මැතිනියට. [බාධා කිරීම්] පොඩ්ඩක් අහගෙන ඉන්නකෝ. ජනාධිපතිතුමා තමයි ලියලා තිබෙන්නේ. අපි නොවෙයි. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමායි ලියුම ලියලා තිබෙන්නේ, ශිරානි බණ්ඩාරණායකට මෙම අග්‍ර විනිශ්චයකාර ධුරයේ වැඩ භාර ගන්න කියලා. අපේ ජනාධිපතිතුමා තමුන්නාන්සේලාගේ පක්ෂයේ සභාපතිතුමා. එතකොට එතුමාගෙන් තමයි මෙය අහගන්න ඕනෑ. [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කුමන්ත්‍රණය කළා, ජනාධිපති වෙන එක අහෝසි කරන්න. [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි මොනවා කරන්නද? [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මහින්ද රාජපක්ෂ එක්ක මොහාන් පීරිස් කුමන්ත්‍රණය කළා, මැතිවරණ ප්‍රතිඵල අහෝසි කරන්න. [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
අපිට කරන්න දෙයක් නැහැ.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වෙනවා. ඉන් පිටස්තරව, සාමාන්‍ය කම්කරුවෙක්වත් ඉවත් නොකරන විධියට තමයි එතුමාව ඉවත් කළේ. ඒ නිසායි, අපේ මේ විරෝධතාව.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු විපක්ෂනායකතුමා

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
දැන් මෙම අවස්ථාවේදී, මෙතැනදී අපේ පක්ෂයේ නායකතුමාගේ නම ඇඳුන නිසා, මම මෙය කියන්නට ඕනෑ. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අපට ඉතා පැහැදිලිව උපදෙස් ලබා දීලා තිබෙනවා. එතුමා කිව්වා, මෙම දින සියයේ වැඩසටහන වේවා, වෙනත් පාර්ලිමේන්තුවේ කරන වැඩ කටයුත්තක් වේවා ඒ පිළිබඳව අඩුපාඩුකම් තිබෙනවා නම් විවේචනය කිරීමේ පූර්ණ අයිතිය අපටත් දෙනවා; ඒ වාගේම රජයේ ඉන්න ඕනෑම කෙනෙකුටත් දෙනවා කියලා. ඒ නිසා එතුමාට එරෙහිව යන ක්‍රියාවක් නොවෙයි අපි මේ කරන්නේ. අපේ අදහස් පළ කිරීමේ නිදහස මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා අපට තහවුරු කර දීලා තිබෙනවා. ඒ නිදහස ක්‍රියාත්මක කරන්නයි මෙම අවස්ථාව ඉල්ලා සිටින්නේ කියන කාරණාව මම ඉතාම පැහැදිලිව කියන්නට ඕනෑ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමා

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, දවස් 100යේ වැඩසටහනේ 94වන අංකය හැටියට තිබෙන්නේ ශිරානි බණ්ඩාරනායක මැතිතුමිය යළිත් සේවයේ පිහිටුවා අයිතිවාසිකම් ලබා දෙනවා කියලායි. මෙතැන ප්‍රශ්නය වෙලා තිබෙන්නේ ඒක නොවෙයි. ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, මේ කරන ලද ක්‍රමවේදය හරි ද කියලායි. මේ ක්‍රමවේදය කරන්නට ඕනෑ ද, නැත්නම් පාර්ලිමේන්තුවට කියලා කරන්න ඕනෑ ද කියලායි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. ඉවත් කරපු එක ගැන වාදයක් නැහැ. ඉතින් ඕකට මොකද හදිස්සිය? අපි 05 වෙනිදාට ඒ විවාදය කරමු. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා මෙම පාර්ලිමේන්තුවේදී කරන ලද ප්‍රකාශයේ හරය හැටියට ගන්නවා නම් තිබෙන්නේ, පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව නිසි ආකාරයෙන් සම්මත වුණා ද, ඒ යෝජනාව ස්ථාවර නියෝග යටතේ පත් කරන ලද කමිටුව මඟින් කරන ලද නිර්දේශය මත සිදු වුණාද, ඒක නියමාකාරයෙන් සන්නිවේදනය වුණා ද කියන කාරණායි. දැන් මතු වෙන්නේ මේ පාර්ලිමේන්තුව පිළිබඳ වරප්‍රසාද ප්‍රශ්නයක්. [බාධා කිරීමක්]ඒක නිසා එතුමා මෙතැන නිවැරදිව සඳහන් කළා වාගේ, -ගරු අග්‍රාමාත්‍යතුමාත් පිළිගත්තා නේ මෙතැන ක්‍රම වේදය පිළිබඳවයි ප්‍රශ්නය තිබෙන්නේ කියන එක.- පාර්ලිමේන්තුවේ සිටින ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් සියලුම මන්ත්‍රීවරුන්ට ඒ පිළිබඳව අදහස් දක්වන්නට අයිතියක් තිබෙනවා. පාර්ලිමේන්තුව උත්තරීතරයි. අපි මේ ඉල්ලා සිටින්නේ මුළු පාර්ලිමේන්තුවේම -එක මන්ත්‍රීවරයෙකුගේ නොවෙයි,- වරප්‍රසාදයක් පිළිබඳ ප්‍රශ්නයක් සාකච්ඡා කරන්නටයි. එහෙමනම් ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න කියලා තමයි ඉල්ලා සිටින්නේ. මෙතැනදී විධායකය මේකට සම්බන්ධ කර ගැනීමට අවශ්‍යතාවක් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අග්‍රාමාත්‍යතුමා කළේ අමාත්‍යාංශ නිවේදනයක්. සාමාන්‍යයෙන් අමාත්‍යාංශ නිවේදනයක් කළාම ඒක- [බාධා කිරීමක්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මම එක කාරණයක් කියන්නම් ගරු කථානායකතුමනි. මගේ කථාවේදී කිසි විටෙක මෙම සභාවේ සිදු වුණු දෙයක් සම්බන්ධයෙන් මම ප්‍රශ්නයක් ඇති කළේ නැහැ. මම කිව්වා, මම එම යෝජනාවට විරුද්ධ වුණා; විරුද්ධව ඡන්දය දුන්නා කියලා. මෙතැන තිබෙන්නේ අදාළ යෝජනාව නොවෙයි කියලා මම කිව්වා. මෙතැන සිදු වුණ ඒ අනුව සඳහන් කළා.

ඔබතුමා කිව්වේ, පළමුවන යෝජනාවට -Item No. 1 එකට- මේක ඇති කියලා. ඒක ඔබතුමා යැව්වා, ජනාධිපති කාර්යාලයට, ජනාධිපතිතුමාට. මේ ගොඩනැඟිල්ලේ ඇතුළේ සිදු වුණ මොනවා ගැනවත් මම ප්‍රශ්න කරන්නේ නැහැ. ඔබතුමාගේ ලිපියේ ඔබතුමා නියම වශයෙන් කිව්වා, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 78අ. (2) යටතේ කටයුතු කරගෙන ගියා කියලා.

මේ ගොඩනැඟිල්ල තුළ සිදු වුණු දේ ගැන ප්‍රශ්නයක් නැහැ. ප්‍රශ්න ඇති වුණේ අනෙක් ගොඩනැඟිල්ලේ. ජනාධිපති කාර්යාලයට යුතුකමක් තිබුණා ඒක බලලා කියන්න, ඒක හරියටම වුවමනා දෝෂාභියෝගයක්ද, නොවෙයිද කියලා. අපට වාද කරන්න පුළුවන්, ජනාධිපති කාර්යාලය ඇතුළේ මොකක්ද වුණේ කියලා. මේ සභාව ගැන මම කිසිම විවාදයක් කරන්නේ නැහැ. මම මේකට විරුද්ධ වුණාට, මම මේ ප්‍රශ්නය මතු කළාට මේ සභාව ගැන මොකුත් කියලා නැහැ. මේ සභාව ගත්තු තීරණය හරිද, වැරැදිද කියලා කියන්න මට වැඩක් නැහැ. ඒ නිසා මෙතැන සිදු වුණු දේ ගැන ප්‍රකාශ කරන්න දෙයක් නැහැ. මෙතැන අපට ප්‍රකාශ කරන්න තිබෙන්නේ ජනාධිපති කාර්යාලයේ මොකක්ද සිදු වුණේ කියන එකයි. ඒ ගැන අපි වාද කරමු. ඒ වාගේම ඔබතුමන්ලා දැන් කියන්නේ මේ ක්‍රමවේදය ගැනයි. අපි කියන්නේත් ඒ ක්‍රමවේදය ගැන මිසක් මේ සභාව ගැන නොවෙයි. [බාධා කිරීම්] මෙතැන තිබෙන්නේ, ඒ අවස්ථාවේ ජනාධිපති කාර්යාලය දෝෂාභියෝගයක් ගත්ත එක හරිද, නැද්ද කියන කාරණයත්, දැන් ජනාධිපති කාර්යාලය මේකට දෝෂාභියෝගයක් නොතිබෙනවා

කියන එක හරිද නැද්ද කියන කාරණයත් විමසා බැලීම විතරයි. ඒ දෙකම දිහා බලා වාද කරන්න ඕනෑ. මේක හදිසි එකක්. මමත් ඒක නැහැ කියන්නේ නැහැ. 4වැනි දා නිදහස් දිනය වාගේම 3වැනි දා පෝය දිනයයි. ඒ නිසා මෙතැනට අපට එන්න බැරි වෙනවා. ඒ නිසා මම කියන්නේ 5වැනි දා පස්වරු 6.30ට මේ සම්බන්ධ විවාදය ගනිමුය කියලායි. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි, - [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඇහුම් කන් දෙන්න.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

අපට අද රැස් වෙලා සාකච්ඡා කරන්න වැදගත් දෙයක් තිබෙනවා. අපි පක්ෂ නායකයින් එක්ක එකඟ වුණු ස්ථාවර නියෝග යෝජනා ඔක්කෝම අපි අද න්‍යාය පත්‍රයට ඉදිරිපත් කර තිබෙනවා. අද ඒ න්‍යාය පත්‍රය අනුව වැඩ කරලා, ඊළඟට එන පළමු වැනි රැස්වීම් දවස වන තමයි 5වැනි දා මේ ගැන විවාද කරන්න පුළුවන්. අපි කිව්වේ 9වැනි දා විවාද කරමු කියලායි. නමුත් විපක්ෂ නායකතුමා කිව්වා 5වැනි දා දෙන්න කියලා. 5වැනි දා පස් වරු 6.30 සිට ඕනෑ තරම් වේලාවක් සාකච්ඡා කරන්න, ඊට පස්සේ ආපහු 9වැනි දා නැත්නම් 10 වැනි දා නැවත ගන්න. ඒ ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා. [බාධා කිරීම්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

එහෙම කරන්න එපා, කරුණාකරලා අපට කථා කරන්න අවස්ථාව දෙන්න. ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශයේ සඳහන් කරුණු මේ පාර්ලිමේන්තුව ඇතුළේ අද අපට සාකච්ඡා කරන්න අවසරය දෙන්න. අපි ඉල්ලන්නේ එච්චරයි. එතුමාගේ ප්‍රකාශයේ සඳහන් වෙච්ච කරුණු ගැන අපි සලකා බලන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම ගත්තොත් ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා ඒ විශේෂ කාරක සභාවේ හිටියා. වර්තමාන විපක්ෂ නායකතුමා, එතුමා ඒකේ සභාපති හැටියට හිටියා. ඒ වාගේම ඒ විවාදයේදී වර්තමාන ජනාධිපතිතුමා ඇතුළු ගොඩක් මන්ත්‍රීවරු ඒ අවස්ථාවේ කථා කරලා ඒ ක්‍රියාවලිය අනුමත කරලා තිබෙනවා. අද එක පාරටම ඒකේ දෝෂයක් හොයාගෙන. මෙතුමන්ලා ඇයි මොහාන් පීරිස් මහත්මයාට ඉල්ලා අස්වෙන්න කියලා ඉල්ලීමක් කළේ, ඒ පත්වීම නීත්‍යානුකූල නැත්නම්? නීත්‍යානුකූලව පත් නොවෙච්ච කෙනෙකුගෙන් ඉල්ලා අස්වෙන්න කියලා ඉල්ලන්න දෙයක් නැහැ. ගරු අගමැතිතුමාගේ ප්‍රකාශයේම කිව්වා, අවස්ථා ගණනාවකදී ඉල්ලා අස්වෙන්න කිව්වා කියලා. එහෙම නම් ඉල්ලා අස්වෙන්න කියලා කියන්න ඕනෑ නැහැ, නීත්‍යානුකූලව පත් වුණේ නැත්නම්. ඇත්ත කථාව වුණේ එක එක මැර කල්ලි යවලා තර්ජනය කරලා, භය ගන්වලා ඉල්ලා අස් කරන්න බැලුවා. [බාධා කිරීම්] බැරි වුණාම තමයි එක පාරටම අලුත් law point එකක් හොයා ගත්තේ. [බාධා කිරීම්] අලුත් law point එකක් හොයා ගත්තා. ඒ නිසා මේක අපි පිළිගන්නේ නැහැ. ඒ නිසා අපි ඉතා ඕනෑකමින් ඉල්ලනවා, මේ අලුත් නීති තර්ක දාලා මේ අකටයුත්ත, - [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, මොහාන් පීරිස් අයින් කරන්න මේ සභාවට යෝජනාවක් ගෙනැල්ලා ඒක කළා නම් අපි ඒ ගැන ප්‍රශ්නයක් කරන්නේ නැහැ. ඒ අයිතිය නැත්තේ නැහැ. මේ කරපු විධියත් එක්ක මේ රටේ මුළු අධිකරණ ක්ෂේත්‍රයම සම්පූර්ණයෙන්ම තුෂ්ණිම්භූත වෙලායි තිබෙන්නේ. [බාධා කිරීම්] මම කලිනුත් කිව්වා, උසාවිවලට ගිහිල්ලා කරන දේවල්. ඒ ගැන විතරයි අපි කථා කරන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අගමැතිතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ඊට වඩා මට කියන්න වැඩක් නැහැ. [බාධා කිරීම්] මොහාන් පීරිස් මැතිතුමා මට කිව්වේ තානාපතිකමක් දෙනවා නම් ඉල්ලා අස්වෙන්නම් කියලා. මම හිතුවා, මේ ප්‍රශ්නය විසඳා ගන්න ඒක හොඳයි කියලා. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මේ සභාවේ මොහාන් පීරිස් මහතා නොමැති වුවත් මම වග කීමෙන් අග්‍රාමාත්‍යතුමාට කියනවා, මොහාන් පීරිස් මහතා ඉල්ලා අස්වීමක් දීමට එකඟ වුණේ නැහැ කියලා. කිසිම අවස්ථාවක ඉල්ලා අස්වීමක් දීමට,- [බාධා කිරීම්] ඔබතුමාත් දන්නවා සත්‍යය; මමත් දන්නවා. එකඟ වුණේ නැහැ. ඒ නිසා අපට වාදයක් දෙන්න. දැන් තමුන්නාන්සේ අලුත් පිටුවක් ආරම්භ කළා. අපට වාදයක් දෙන්න. මොහාන් පීරිස් මැතිතුමාගෙන් ඉල්ලා අස්වීම ඔබතුමා ඉල්ලුවාට, එතුමා ඉල්ලා අස්වීමක් දුන්නේ නැහැ. ඇයි, ඔබතුමා ඉල්ලා අස්වීමක් ඉල්ලුවේ වලංගු නැති මිනිහෙක් නම්? වලංගු නිසා නේ ඉල්ලා අස්වීමක් ඉල්ලුවේ.

Hon. Prime Minister, what I am trying to say is that a retirement is different to a resignation. I am telling you with responsibility. I will present this case with responsibility. That is why we want time. We do not want to get involved personally with the Hon. Prime Minister on any matter. He has tried his best, perhaps in a way to resolve it, but the Bar Association came and forced him to accept their conditions. - [*Interruption.*] You said that the Bar Association forced the Government to accept these conditions of forcibly removing Mohan Peiris. What you said is recorded. You said it just two hours ago. What you said is true. That is what happened. You were trying to resolve, but the Bar Association took the matter into their hands and forced you all to act like thugs and throw out Chief Justice, Mohan Peiris and install a lady in that chair. That is the fact.

ගරු කථානායකතුමනි, අපට මේ ගැන විවාද කරන්න අගමැතිතුමා වෙලාව දීලා දැන් ඉවරයි. මේ වෙලාව අපි තව ටිකක් අරගෙන යමු. විපක්ෂ නායකතුමාට කතා කරන්න දෙන්න, විපක්ෂ නායකතුමා කතා කරයි. මම ඉල්ලා සිටින්නේ ඒකයි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මා ගැන සඳහන් කළ නිසායි මම මෙය කියන්නේ. විශේෂයෙන්ම කිසි විටෙක මම මොහාන් පීරිස්ට ඉල්ලා අස් වෙන්න කිව්වේ නැහැ. එතුමායි මට කතා කළේ. මම එක පියවරක් ගත්තා, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, [බාධා කිරීම්] මම එතුමා එක්ක තනිවම කතා කළේ නැහැ. මම මොහාන් පීරිස් ගැන දන්නා නිසා සෑම වෙලාවේම සාක්ෂිකාරයින් තියා ගෙනයි කතා කළේ. [බාධා කිරීම්] අනෙක, මොහාන් පීරිස් මැතිතුමා තමන්ගේ භාර්යාව එක්ක ඇයි එදා රෑ ජනාධිපතිතුමා හම්බ වෙන්න ගියේ appointment එකක් නැතිව? [බාධා කිරීම්] අපි දන්නවාද? [බාධා කිරීම්] අපි ඔක්කොම කියන්නම්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු අගමැතිතුමා දැන් මේ ප්‍රශ්නය කතා කරන වෙලාවේ අලුත් දෙයක් එකතු කළා. අපට ඕනෑ විවාදයක්. මේවා විවාදයේදී ගත යුතු කරුණු. නමුත් එතුමා පෙන්වන්න හැදුවා, මේ සභාවේ ක්‍රියා දාමයක් එතුමා ප්‍රශ්නයට ලක් කළේ නැත කියලා. මේ සභාවේ ගත්ත ක්‍රියා දාමය තමයි එදා හිටපු අග්‍ර විනිශ්චයකාරවරිය ඉවත් කිරීම. ඒක තමයි ප්‍රශ්නයට ලක් කරලා තිබෙන්නේ. [බාධා කිරීම්] ඒක තමයි ප්‍රශ්නයට ලක් කරලා තිබෙන්නේ. [බාධා කිරීම්]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමා උපදේශකද? [බාධා කිරීම්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
පන්දම්කාරයා. අද පන්දම්කාරයා. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ ප්‍රකාශය පිළිබඳව විවාදයක් දෙන්න එකඟ වෙලා තිබෙනවා. [බාධා කිරීම්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අද පන්දම්කාරයා, අද පන්දම්කාරයා. [බාධා කිරීම්] මට කතා කරන්න දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා, කතා කරන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මට කතා කරන්න දෙන්න. [බාධා කිරීම්] කථානායකතුමා මට ඉඩ දීලා තිබෙනවා. මම දන්නේ නැහැ තවත් කථානායක කෙනෙක් මට පිටුපස ආසනයකත් ඉන්නවාද කියලා. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, -[බාධා කිරීම්] අපේ අගමැතිතුමා කිව්වා මේ සභාවේ ක්‍රියා දාමය කිසි ලෙසක දෝෂ දර්ශනයට ලක් කළේ නැහැයි කියලා. එහෙම නම් මේ සභාවේ ක්‍රියා දාමය අනුව ගනු ලැබූ තීරණය කොහොමද ප්‍රශ්නයට ලක් කළේ? ප්‍රශ්නයට ලක් කළේ කවුද? ඒ බලය තිබෙන්නේ කාටද? ඒක තමයි මෙතැන ප්‍රශ්නය. මේ සභාවේ ක්‍රියා දාමය අනුව ඉවත් කරනු ලැබූ අග්‍ර විනිශ්චයකාරතුමියගේ ඉවත් කරනු ලැබීම, කළු කෝට්කාරයන්ගෙන් කෙස් පැලෙන තර්ක ඉගෙන ගෙන ඇවිල්ලා දැන් තමුන්නාන්සේලා හදන්නේ, "පිදුරු ගහට මුවා වෙලා මිනී මැරුවේ නැහැ" කියන්නද? ඒ නිසා මේ ගැන අපි කතා කරමු. මේ සභාවටයි මේ තර්ජනය එල්ල වෙලා තිබෙන්නේ. මේ සභාවේ උත්තරීතරභාවයට, ඔබතුමාගේ අධිකාරියට, මේ සභාවට ව්‍යවස්ථාවෙන් ලබා දී තිබෙන ප්‍රධානත්වයට අද අභියෝගයක් එල්ලවෙලා. ඇයි? මේ සභාවේ ක්‍රියා දාමය අත්හිටුවලා තිබෙනවා ජනාධිපතිතුමා. ජනාධිපතිතුමාට එවැනි බලයක් ව්‍යවස්ථාවෙන් දීලා නැහැ. ඒ නිසා අපි මේ කාරණය හදිසි කාරණයක්, වැදගත් කාරණයක් හැටියට අද විවාදයට ගත යුතුයි කියා මා ඔබතුමාට බැගෑපත් ලෙස කියනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විවාදයක් ඉල්ලන කොට ඒකට Motion එකක් ඉදිරිපත් කරලානේ ඒක කරන්න ඕනෑ. එහෙම නේද?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
There is a point of Order being raised by the Hon. Felix Perera. What is your point of Order?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ගරු කථානායකතුමනි, microphone එක දීලා නැහැ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ෆීලික්ස් පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ගරු කථානායකතුමනි, අපේ අග්‍ර විනිශ්චයකාරතුමාට threaten කෙරුවාය කියලා දැන් කිව්වා. අපටත් ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. අද වත්තල ප්‍රාදේශීය සභාවේ - [බාධා කිරීම්] මහජන සාමය පිළිබඳ ගරු ඇමතිතුමා - [බාධා කිරීමක්] ඇමතිතුමනි, පොඩ්ඩක් වාඩි වෙන්න. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. තවම කිව්වේ නැහැ. [බාධා කිරීම්] කියනකම් ඉන්න. අද වත්තල ප්‍රාදේශීය සභා රැස්වීමේදී හතර දෙනකුට ගහලා තිබෙනවා. ඒ හතර දෙනාව දැන් ඉස්පිරිතාලයට ඇතුළත් කර තිබෙනවා. මා ඔබතුමාගෙන් ඉල්ලනවා, මේ ගැන

පරීක්ෂණයක් කරන්නය කියලා. [බාධා කිරීම්] මේ ගැන ඔබතුමා පරීක්ෂණයක් කරන්න. කොහොමද එහෙම ගහන්නේ? [බාධා කිරීම්] එතකොට කෝ, යහ පාලනය? [බාධා කිරීම්] කරුණාකර, ඒ ගැන පරීක්ෂණයක් කරන්න. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
අද ප්‍රධාන කටයුතුවලට තිබෙන - [බාධා කිරීම්]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, ගරු පීලික්ස් පෙරේරා මන්ත්‍රීතුමා මොකක්ද සිද්ධියක් ගැන කථා කරනවා. මා අහනවා, එතුමා එතැන සිටියාද කියලා. ඒ සිද්ධිය දකින්න එතුමා ඒ අවස්ථාවේ එතැන සිටියා ද කියලා මා අහනවා. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා ඒ අවස්ථාවේ එතැන සිටියා නම් කියන්න, මා ඒ ගැන විභාග කරන්නම්. [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු කථානායකතුමනි, ඒ ගැන සම්පූර්ණ පරීක්ෂණයක් අපි කරන්නම්. [බාධා කිරීම්] Give me the facts.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු සභානායකතුමා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Speaker, I move,

> "That this Parliament at its rising this day do adjourn until 1.00 p.m. on Thursday, February 05th, 2015."

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Hon. Speaker, we disagree. I request you to get the consent of the House. I propose an amendment to that. [බාධා කිරීම්] "2015 පෙබරවාරි මස 02 වැනි සඳුදා අ.භා 1.00 වන තෙක්" යනුවෙන් මේ යෝජනාව සංශෝධනය කළ යුතු යැයි මා යෝජනා කරනවා. ඒකට සභාවේ එකඟතාව ගන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක ලිඛිතව තිබෙන්න ඕනෑ. [බාධා කිරීම්]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ලිඛිතව දෙන්නට ඕනෑ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I call for a Vote.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
No. You cannot take a Vote like that.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I call for a Vote. - [*Interruption.*]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
සභාවේ වැඩ කටයුතු සියලු දෙනාගේම එකඟතාවෙන් යුතුව සාමකාමීව කරන්නට ඕනෑ. ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ කරුණ පිළිබඳව තව දුරටත් සාකච්ඡා කර බැලීම සඳහා සභාවේ කටයුතු විනාඩි 10කට අත් හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 4.15ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 4.15 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 4.15 p.m. and then resumed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
Order, please! කරුණාකර, ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ගේ අසුන්වලට යන්න. සභාව ඊළඟ දිනය තෙක් කල් තබන ලද බව දන්වමි.

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 4.16 ට, 2015 පෙබරවාරි 05 වන බ්‍රහස්පතින්දා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 4.16 மணிக்கு பாராளுமன்றம், 2015 பெப்ருவரி 05, வியாழக்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 4.16 p.m. until 1.00 p.m. on Thursday, 05th February, 2015.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා කොළඹ 5 කිරුළපන මාවතේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

ஹன்சாட் பிரதிகளை கொழும்பு 5, கிருலப்பனை மாவத்தையிலுள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

Hansard Reports can be purchased from the Government Publications Bureau at the Department of Government Information, Kirulapone Avenue, Colombo 5.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.